# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,669 – 2010 අගෝස්තු මස 27 වැනි සිකුරාදා – 2010.08.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස : (II අ) වැනි ඡෙදය - පළකිරීම්

I වැනි කොටස : (II අ) වැනි ඡෙදය - පළකිරීම් මෙවර පළ නොවන බව කරුණාවෙන් සලකන්න

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

### ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**කරාපිටිය ශික්ෂණ රෝහල - ගාල්ල**

කරාපිටිය ශික්ෂණ රෝහලේ පහත සඳහන් ගොඩනැගිලි අළුත්වැඩියාව සඳහා ටෙන්ඩර්පත් 2010.09.14 දින පෙ.ව. 10.30 දක්වා භාරගනු ලැබේ.

| වැඩ ඒකකය | අවම ලියාපදිංචිය | ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පතු |
|---|---|---|
| නව පිළිකා ඒකකයෙහි අපවිත්‍ර ජල අවහිරතා හා වැසිකිලි අවහිරතා ඉවත් කිරීමට මාර්ග හා ස්ථාන සකස් කිරීම | රු. 20,00,000 (ICTAD) හෝ ඉහල | රු. 2,000 |

ඉහත සඳහන් වැඩ ඒකකයේ ඉදිරියෙන් දක්වා ඇති ප්‍රමාණ සඳහා ඉදිකිරීම්, පුහුණු කිරීම් හා සංවර්ධන ආයතනයේ (ICTAD) ලියාපදිංචි ශ්‍රී ලංකා ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ගේ සංගමයේ සාමාජිකත්වය ලැබූ ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන් මේ සඳහා ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙති.

ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පත් මුදල මෙම කාර්යාලයේ ගණකාධිකාරී වෙත ගෙවා ලබාගත් රිසිට්පත් ඉදිරිපත් කිරීමෙන් පසු 2010.09.13 ප.ව. 3.00 දක්වා අදාළ ටෙන්ඩර්පත් ලබාගත හැක.

ටෙන්ඩර්පත් පිටපත් 02කින් යුතුව අංග සම්පූර්ණව ඉදිරිපත් කල යුතු අතර, ඒවා බහාලන කවරයේ වම්පස ඉහල කෙලවරේ "ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම....................................." යනුවෙන් සඳහන් කර නියමිත දිනට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් හෝ ගණකාධිකාරී කාමරයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුයි. නියමිත වේලාවෙන් පසුව ලැබෙන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ටෙන්ඩර් භාරගැනීම අවසන්වූ වහාම ඒවා විවෘත කරනු ලබන අතර, එම අවස්ථාවට ටෙන්ඩර්කරු හෝ බලයලත් නියෝජිතයෙකුට සහභාගී විය හැක.

ටෙන්ඩර් මණ්ඩල සභාපති.

08-528

---

### බඩු බාහිරාදිය විකිණීම

**ගල්කිස්ස මහෙස්ත්‍රාත් අධිකරණය**

රාජසන්තක කරන ලද සහ හිමිකම් නොකියන ලද නඩු භාණ්ඩ වෙන්දේසි කිරීම

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ, හිමිකම් නොකියන ලද, නඩු අංක මැකී ඇති, නඩු වාර්තා සොයාගැනීමට අපහසු, පහත උපලේඛනයෙහි සඳහන් භාණ්ඩ 2010.09.18 වැනි සෙනසුරාදා පෙ.ව. 9.00 ට ගල්කිස්ස මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙහි පහත උපලේඛනයේ සඳහන් වන කිසියම් භාණ්ඩයක් පිළිබඳව හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර හෝ එදින වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම ස්වකීය හිමිකම් ලියවිල්ලක් මගින් ඉදිරිපත් කළ යුතුය.

වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසි කිරීමට නියමිත සියලුම භාණ්ඩ ප්‍රදර්ශනය කරනු ලැබේ. වෙන්දේසියේ විකිණීමට නියමිත සියලුම භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකිය.

අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගන්නා අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩයක් වෙන්දේසියෙන් ඉවත්කර ගැනීමේ අයිතිය අධිකරණය සතුවේ.

මෙම භාණ්ඩ මිලදී ගන්නා අය මුදල් ගෙවා රිසිට්පත් ලබාගෙන මිළදී ගත් භාණ්ඩ එදිනට අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය. තවද, එම භාණ්ඩ මිලදී ගන්නා අය ස්වකීය හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු අතර, ගෙවීම් සඳහා චෙක්පත්, මුදල් ඇණවුම් කිසිවක් භාර නොගන්නා බවද මෙයින් දන්වනු ලැබේ.

හර්ෂ සේතුන්ග,
මහෙස්ත්‍රාත් සහ අතිරේක දිසා විනිසුරු,

2010 අගෝස්තු මස 09 වැනි දින,
ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**භාණ්ඩ උපලේඛනය**

***2010 සැප්තැම්බර් 18 වැනි දින භාණ්ඩ වෙන්දේසිය***

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ උපලේඛනය |
|---|---|---|
| 01 | ඒආර් 1933/09 / 130 | නිල්පාට මවුන්ටන් පාපැදි 01යි |
| 02 | ඒආර් 1932/09 / 130 | රතු පැහැති ස්පෝට් වර්ගයේ පපැදි 01 යි |
| 03 | ඒආර් 1934/09 / 131 | රිදී පැහැති (අලු පැහැ) මවුන්ටන් පාපැදි 01 යි |
| 04 | ඒආර් 1934/09 / 131 | නිල් පැහැති මවුන්ටන් පාපැදි 01 යි |
| 05 | ඒආර් 1891/09 / 169/09 | කලු සුදු මවුන්ටන් පාපැදි 01 යි |
| 06 | ඒආර් 1891/09/98/09 / 98/09 | කොළ පැහැති ඇට්ලස් වර්ගයේ ස්ටැන්ඩර්ඩ් පාපැදි 01 යි |
| 07 | ඒආර් 1960/09 / 166/09 | මවුන්ටන් වර්ගයේ පාපැදි 01යි |
| 08 | ඒආර් 1960/09 / 166/09 | කලු පැහැති මවුන්ටන් පාපැදි 01යි |
| 09 | ඒආර් 1891/09 / 146/09 | රතු පැහැති මවුන්ටන් පාපැදි 01යි |
| 10 | ඒආර් 1891/09 / 31/09 | නිල් පැහැ පාපැදි 01 යි |
| 11 | ඒආර් 1891/09 / 102/09 | කලුපැහැති පාපැදි 01 යි |
| 12 | ඒආර් 1473/09 / 123/09 | කලු පැහැති (සෙවන්ස්ටාර්) පැපැදි 01 යි |
| 13 | අංක රහිත | රතු පැහැති ස්පෝර්ට් පාපැදි 01යි |
| 14 | ඒආර් 1125/09 | ඩබ්පීපීජේ- 0372 දරන අබලන් වූ යතුරු පැදිය |
| 15 | ඒආර් 1263/09 | චැසි අංක එම්ඩී 621සීඩී 1061 ඩී 05636 දරන ටී. වී. එස්. එක්සෙල් කුපර් වර්ගයේ රතු සහ කලු පාට යතුර ැපැදිය |
| 16 | ඒආර් 372/08 / 109 | අංක 104-3404 දරන අබලන් වූ වැලි වර්ගයේ යතුර පැදිය |
| 17 | ඒආර් 1009/08 / 134/07 | අංක 122-2403 දරන අබලන්වූ යතුරු පැදිය (චැසි අංකය එෆ් 503111447) |
| 18 | ඒආර් 15/09 / 106/07 | අබලන් වූ වැලි වර්ගයේ යතුරු පැදිය |
| 19 | ඒආර් 1127/08 / 185/06 | චැසි අංක එක්ස්වයිඑක්ස් සීබීඑල් 044000 -5333 දරන ෆෝල්කන වර්ගයේ අබලන් වූ යතුරු පැදිය |
| 20 | අංක රහිත | අංක 115 ශ්‍රී 4246 දරන අබලන් වූ යතුරු පැදිය |
| 21 | අංක රහිත | අබලන්වූ වැලි වර්ගයේ යතුරුපැදිය |
| 22 | අංක රහිත | ට්‍රේල් වර්ගයේ අබලන්වූ යතුරුපැදිය |
| 23 | අංක රහිත | සීඑම් වර්ගයේ අබලන් වූ යතුරු පැදිය |
| 24 | අංක රහිත | ජීර් - 2661 අබලන් වූ යතුර පැදිය |
| 25 | අංක රහිත | යමහා ට්‍රේල් වර්ගයේ අබලන් වූ යතුර පැදිය |
| 26 | අංක රහිත | ජීඉසෙඩ් - 8705 "විනර්" වර්ගයේ අබලන් වූ යතුරු පැදිය |
| 27 | අංක රහිත | අංක 132-1845 දරන අබලන් වූ යතුරුපැදිය |
| 28 | අංක රහිත | හීරෝ හොණ්ඩා වර්ගයේ කොටස් වලට වෙන්වී ගිය අබලන් වූ යතුරුපැදිය |
| 29 | අංක රහිත | අංක 203-9417 දරන අබලන් වූ ත්‍රීරෝද රථය |
| 30 | අංක රහිත | ජීවී - 9815 දරන අබලන් වූ ත්‍රීරෝදරථය |
| 31 | අංක රහිත | අංක 21-5735 දරන රතුපාට අබලන් වූ ත්‍රීරෝද රථය |
| 32 | අංක රහිත | අංක 112-9651 දරන හොන්ඩා වර්ගයේ ට්‍රේල් යතුර පැදිය. |
| 33 | අංක රහිත | අබලන් වූ යතුරු පැදිය |
| 34 | අංක රහිත | අංක 135-5928 දරන යමහා වර්ගයේ යතුරු පැදිය |
| 35 | අංක රහිත | අංක 17-7840 දරන වහල රහිත අබලන් වූ ත්‍රීරෝද රථය |
| 36 | ඒආර්1246/09 / 150 | රිදී මාල 01යි |
| 37 | ඒආර් 1247/09 / 40/04 | අඟල් 7, 1/2ක් පමණ දිග අඟල් 1/2 ක් පමණ පළල රන් පාට අත් පළඳනා 01. (බර ග්‍රෑම් 17.1) |
| 38 | ඒආර් 1245/09 / 103/05 | අඟල් 18 ක් දිග සිගප්පූරු චේන් 01යි, කුඩා රන් කුරස 01 යි, කුඩා ළමා රන් මුදු 02 යි, කරාබු ජෝඩු 01 යි (බර ග්‍රෑම් 5.2) |
| 39 | ඒආර් 1932/09 / 32 | රන් පැහැති හතරැස් හැඩයට කපා ඇති චේන් 01 යි (බර ග්‍රෑම් 16.3) |
| 40 | ඒආර් 1935/09 / 132 | මාළුවෙකුගේ හැඩයෙන් යුතු පෙන්ඩනය සහිත අඟල් 16, 1/2 ක් දිග කැරලි හැඩයේ චේන් 01 යි (බර ග්‍රෑම් 10.7) දඟර හැඩයේ රන් පැහැති චේන් 01 යි (බර ග්‍රෑම් 6.8) |
| 41 | ඒආර් 1959/09 / 137/09 | අඟල් 7 දිග සුදු පාට ගල් ඇල්ලූ මල් 07 ක් සහිත කාන්තා අත් පළඳනා 01 යි (බර ග්‍රෑම් 12.5) |
| 42 | ඒආර් 1558/09 / 179/09 | පෙන්ඩනය සහිත දඟර රන් මාල 01යි (බර ග්‍රම් 9.4) |
| 43 | ඒආර් 1958/09 / 178/09 | දඟර සහිත චේන් 01යි (බර ග්‍රෑම් 7.8) |
| 44 | ඒආර් 1955/09 / 25/09 | රන් පැහැති සුර 0 1යි (බර ග්‍රෑම් 0.7) |
| 45 | 47325 / 97/07 (බී 5228/07) | (1) රන් කැබලි 02 යි (බර ග්‍රෑම් 8.3)<br>(2) කරාබු ජෝඩු 01 යි (බර ග්‍රෑම් 2.5) |
| 46 | 26102 / 94/04 (බී 5571/5) | රන් පැහැති කාන්තා මුදු 04 යි (බර ග්‍රෑම් 3) කරාබු ජෝඩු 01 යි (බර ග්‍රෑම් 0.4) |
| 47 | බී 1164/08 / 179/8 | බැරල් හැඩයේ කාන්තා රන් මුදු 01 යි බර (ග්‍රෑම් 1.4) |
| 48 | බී 2427/04 / 41/05 | කරාබු ජෝඩු 02 යි (බර ග්‍රෑම් 0.8) |
| 49 | 37298 / 155/98 | අඟල් 20 ක් දිග රන් පැහැති දඟර හැඩයේ චේන් 01 යි (බර ග්‍රෑම් 5.9) |
| 50 | බී 3852/06 / 171/08 | රන් පැහැති කුරු 02 යි (බර ග්‍රෑම් 11.3) |
| 51 | බී 3852/06 / 183/08 | රන් පැහැති කැබලි 02යි (බර ග්‍රෑම් 15.9) |
| 52 | බී 3852/06 / 184/08 | රන් පැහැති මාල 01 යි (බර ග්‍රෑම් 7.9) |
| 53 | ඒආර් 1896/09 / 33/09 | ටී. වී. එස්. වර්ගයේ කළු පැහැති මොපෙඩ් යතුරු පැදිය |
| 54 | ඒආර් 1891/09 / 169/09 | අඟල් 7, 1/2 x 7, 1/2 එක්සයිඩ් බැටරි 02 යි |
| 55 | ඒආර් 1891/09 / 198/08 | පැනසොනික් වර්ගයේ විදුලි අවන් 01 යි |
| 56 | ඒආර් 1937/09 / 90 | වාහන වලට සවිකරන ලද සනී වර්ගයේ සංඥා පහන් දෙකයි |

---

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 සැප්තැම්බර් මස 03 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 අගෝස්තු මස 20 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ උපලේඛනය |
|---|---|---|
| 57 | ඒආර් 1936/09<br>189/09 | කැෂියෝ වර්ගයේ අබලන් වූ පිරිමි අත් ඔරලෝසු 01 යි |
| 58 | ඒආර් 1936/09<br>189/09 | සිටිසන් වර්ගයේ කාන්තා අත්ඔරලෝසු 01 යි |
| 59 | ඒආර් 1936/09<br>189/09 | පැනසොනික් වර්ගයේ ඉයර්ෆොන් 01යි<br>සුදු පාට වයර් කෝඩ් 01 යි<br>කළු පාට වයර් කෝඩ් 01 යි<br>I-Ron රේඩියෝ 01 යි |
| 60 | ඒආර් 1935/09<br>132. | ටයිගර් වර්ගයේ නිල් පැහැති ජෙනරේටර් 01යි |
| 61 | ඒආර් 1934/09<br>131 | නිල් පැහැති ගෑස් සිලින්ඩර් 01 යි |
| 62 | ඒආර් 1931/09<br>28/06 | යකඩ ඇණ ග්‍රෑම් 500 යි |
| 63 | ඒආර් 1933/09<br>130 | ආටෙක් වර්ගයේ කාර් කැසට් 01යි |
| 64 | ඒආර් 1933/09<br>130 | සන්යෝ වර්ගයේ රේඩියෝ 01යි |
| 65 | ඒආර් 1933/09<br>130 | සොනිකා වර්ගයේ රේඩියෝ කැසට් යන්ත්‍ර 01 යි |
| 66 | ඒආර් 1933/09<br>130 | ඔරේන්ජ් වර්ගයේ සීලිං පැන් 0 1යි |
| 67 | ඒආර් 1933/09<br>130 | පිලිප්ස් වර්ගයේ විදුලි ස්ත්‍රික්ක 01 යි |
| 68 | ඒආර් 1933/09<br>130 | නොකියා වර්ගයේ ජංගම දුරකථන 01 යි. |
| 69 | ඒආර් 1933/09<br>130 | ටීසීඑල් වර්ගයේ අඟල් 21 වර්න රූපවාහිනී 01 යි |
| 70 | ඒආර් 193/09<br>130 | ඩේටිරෝන් වර්ගයේ වීසීඩී යන්ත්‍ර 01 යි |
| 71 | ඒආර් 1957/09<br>198/08 | නොකියා වර්ගයේ ජංගම දුරකථන 01 යි |
| 72 | ඒආර් 1956/09<br>93/09 | නොකියා වර්ගයේ කලු, රතු ජංගම දුරකථන 01 යි |
| 73 | අංක රහිත | වයර් පුලුස්සා ලබාගන්නා ලද තඹ කම්බි උර 02 යි |
| 74 | අංක රහිත | දොරවල් සෑදීමට ගන්නා ඇලුමිනියම් බොක්ස් බාර් 13 යි |
| 75 | අංක රහිත | (මෙෂර්ටෙක් වර්ගයේ ඔරලෝසු මුහුණැති නිල් පාට තරාදි 01 යි |
| 76 | අංක රහිත | නොකියා වර්ගයේ නිල්, අළු පාට ජංගම දුරකථන 0 1යි |
| 77 | අංක රහිත | 3310 වර්ගයේ නිල්, සුදු පැහැති ජංගම දුරකථන 01 යි |
| 78 | අංක රහිත | කළු පාට එරික්සන් වර්ගයේ ජංගම දුරකථන 01 යි |
| 79 | අංක රහිත | එරික්සන් වර්ගයේ කලු, නිල් ජංගම දුරකථන 01යි |
| 80 | අංක රහිත | කේඑෆ් 788 එරික්සන් වර්ගයේ කලු පාට ජංගම දුරකථන 01 යි. (බැටරිය සමග පිටුපස කොටස නැත) |
| 81 | අංක රහිත | මෝටරෝලා වර්ගයේ කලු පාට ජංගම දුරකථන 01 යි (පිටුපස කොටස නැත) |
| 82 | අංක රහිත | එරික්සන් වර්ගයේ සුදු, නිල් ජංගම දුරකථන 01යි |
| 83 | අංක රහිත | මෝටරෝලා වර්ගයේ කලු පාට ජංගම දුරකථන 01 යි |
| 84 | අංක රහිත | මෝටරෝලා වර්ගයේ කලුපාට ජංගම දුරකථන 01 යි |
| 85 | අංක රහිත | නොකියා වර්ගයේ කළු , අළු පාට ජංගම දුරකථන 01 යි |
| 86 | අංක රහිත | නොකියා වර්ගයේ කලු ජංගම දුරකථන 01 යි (ආවරණය සමග) |
| 87 | අංක රහිත | ඇල්කටෙල් වර්ගයේ ජංගම දුරකථන 01 යි |
| 88 | අංක රහිත | AOIDI ලෙස හැඳින්වෙන කොළ පාට මුහුණත රිදීපාට පටිය සහිත පිරිමි අත්ඔරලෝසු 0 1යි |
| 89 | අංක රහිත | කළු පාට අව් කන්නාඩි 0 1යි |
| 90 | අංක රහිත | රතු, කලු මිටසහිත ඉස්කරුප්පු නියන් 0 1යි |
| 91 | අංක රහිත | කිව් ඇන්ඩ් කිව් වර්ගයේ නිකල් පාට මුහුණත කලු පටිය සහිත පිරිමි අත් ඔරලෝසු 01 යි |
| 92 | අංක රහිත | කළු පටිය සහිත කැෂියෝ වර්ගයේ කාන්තා අත් ඔරලෝසු 01 යි |
| 93 | අංක රහිත | වර්ගය අපැහැදිලි නිකල් පාට අත් ඔරලෝසු 01යි |
| 94 | අංක රහිත | රෝස පාට මුහුණත නිකල් පාට කාන්තා අත් ඔරලෝසු 01 යි |
| 95 | බී 1164/08<br>180/08 | නොකියා වර්ගයේ කළු - අළු පාට ජංගම දුරකථන 0 1යි |
| 96 | බී 1164/08<br>180/08 | නොකියා වර්ගයේ, නිල්, සුදු පාට ජංගම දුරකථන 01 යි |
| 97 | 54493<br>152/10 | සවල් එකයි |
| 98 | 54493/<br>152/10 | ප්ලාස්ටික් බකට් 09 යි |
| 99 | 4727/එස්/10 | පියන සහිත කොළ පාට ප්ලාස්ටික් කුඩා ජොග් 01යි |
| 100 | 4726/එස්/10 | ඇල්කටෙල් වර්ගයේ ජංගම දුරකථන බැටරි 01යි |
| 101 | 4721/එස්/10 | අඟල් 1 ප්‍රමානයේ පී. වී. සී. බෙන්ඩ් 01 යි |
| 102 | ඒආර් 1488/09<br>66/09 | එල්ජී වර්ගයේ සී. එෆ් 0700 වර්ගයේ ජංගම දුරකථන 01 යි |
| 103 | ඒආර් 1188/09 | නොකියා වර්ගයේ කලු පැහැති ජංගම දුරකථන 0 1යි |
| 104 | ඒආර් 912/9 | සිටිසන් වර්ගයේ නිකල් පැහැති පිරිමි අත් ඔරලෝසු 01 යි (අබලන් වූ) |
| 105 | අංක රහිත | ගෑස් ලිපක කොටස් 01යි |
| 106 | අංක රහිත | අඩි 1 x 2 ප්‍රමාණයේ අබලන් බෆල් 0 1යි<br>අඟල් 6 x 18 ප්‍රමාණයේ බෆල් 02 යි |
| 107 | අංක රහිත | හිස් අසුරන 05 යි<br>කෑන් 07 යි<br>බූලි 0 2යි<br>වීදුරු බෝතල් අඩංගු පොහොර උර 03 යි<br>සුදු පැහැති වීදුරු 06 යි |
| 108 | 51520 | තැඹිලි පාටට හුරු ප්ලාස්ටික් පැදුරු 01යි |
| 109 | 53790 | කොළ, සුදු පැහැති ප්ලාස්ටික් පැදුරු 01යි |
| 110 | අංක රහිත | මැෂින් පැදුරු 01යි |

08-582

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

2011 ජනවාරි මස 01 වැනි දින සිට 2011 දෙසැම්බර් 31 වැනි දින දක්වා රා තැබැරුම් රේන්ද විකිණීම

2011 ජනවාරි 01 වැනි දින සිට 2011 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය තුල රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයකටම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබැරුම් සඳහා ටෙන්ඩර් බාර ගනු ලැබේ :

01. සෑම ටෙන්ඩරයක්ම ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින්ම ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයෙහි දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කල බවට ලබා ගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයෙන් යටත් පිරිසෙයින් 15%කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිනිය යුතුය.

02. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එකී මුද්‍රණයෙහි වම් කෙලවරෙහි 'අංක .................. දරන රා තැබැරුම සඳහා ටෙන්ඩර් පත්‍රය' යනුවෙන් සඳහන් කොට 2010.09.21 වැනි දින පෙ. ව. 10.30ට පෙර වත්තල ප්‍රාදේශීය ලේකම් ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

03. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළ වී ඇති අංක 207 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ දැක්වෙන රා රේන්ද කොන්දේසි වලට අනුකූල විය යුතුය.

04. 2010.09.21 වැනි දින පෙරවරු 10.30ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කල වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරණු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

05. පූර්වාසන්න දින විකිණීමට නොහැකි වූ රා තැබැරුම් රේන්ද නැවත විකිණීම 2010.11.15 වැනි දින පෙරවරු 10.30ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය.

06. මේ සම්බන්ධ වැඩි විස්තර වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකිය.

චන්දිමා දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
වත්තල.

2010 අගෝස්තු මස 04 වැනි දින,
වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| කොට්ඨාසය | ග්‍රාමය | ටෙන්ඩර්පත් භාර ගන්නා අවසාන දිනය හා වේලාව | ටෙන්ඩර් තැන්පත් මුදල රු. |
|---|---|---|---|
| වත්තල | අංක 01-තිඹිරිගස්යාය | 2010.09.21 පෙ. ව. 10.30 | 7,260 |
| වත්තල | අංක 02-උස්වැටකෙයියාව | එම | 4,840 |
| වත්තල | අංක 07-බෝපිටිය | එම | 7,260 |
| වත්තල | අංක 08-මහවත්ත | එම | 6,050 |

08-567

**ජාඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**

2011 ජනවාරි මස 01 දින සිට 2011 දෙසැම්බර් මස 31 දින දක්වා කාලය සඳහා රා තැබැරුම් රේන්ද විකිණීම

2011 ජනවාරි මස 01 වැනි දින සිට 2011 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයකටම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබැරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම ඕනෑම ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයෙහි දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයෙන් යටත් පිරිසෙයින් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතුය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙලවරෙහි "අංක... දරන.... රා තැබැරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් පහත ලේඛනයෙහි සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2010.09.23 දින පෙ.ව. 10.3 0 ට පෙර ජාඇල ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් එම වේලාවට පෙර ජාඇල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළ වී ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූලව විය යුතුය.

05. 2010.09.23 වැනි දින පෙ.ව. 10.30 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් ජාඇල ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබැරුම් නැවත විකිණීම 2010.11.16 දින පෙ.ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර ජාඇල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකිය.

ඩබ්. එම්. ඒ. පී. බී. වන්නිනායක,
ප්‍රාදේශීය ලේකම්,
ජාඇල.

මගේ අංකය : 1/1/7/2
2010 අගෝස්තු 05 දින,
ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය,
ජාඇල.

**උපලේඛනය**

| කොට්ඨාසය | ග්‍රාමය | ටෙන්ඩර් භාරගන්නා අවසන් දිනය හා වේලාව | ටෙන්ඩර් තැන්පත් මුදල (රුපියල්) |
|---|---|---|---|
| ජාඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | කඳාන | 2010.09.23 පෙ.ව. 10.30 | 1,500.0 |
| එම | වැලිගම්පිටිය | එම | 1,500.0 |
| එම | කනුවන | එම | 4,000.0 |
| එම | ඒකල | එම | 5,000.0 |
| | මෙගොඩ | | |
| එම | දඬුගම | එම | 1,000.0 |

08-648

# රජයේ නොවන දැන්වීම්

**නිවේදනයයි**

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 05 වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වා සිටිමු.
ලියාපදිංචි සමාගමේ නම : ෂෙප්ලොග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 73471
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 149/11/2, අඹහේන වත්ත, කඩවත පාර, ගණේමුල්ල
ලියාපදිංචි කළ දිනය : 2010 ජූලි මස 29 දින

08-694

---

**නිවේදනයයි**

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 05 වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වා සිටිමු.
ලියාපදිංචි සමාගමේ නම : ඩී. ජී. ඊ. අබේවර්ධන හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 73212
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 149/11/2, අඹහේන වත්ත, කඩවත පාර, ගණේමුල්ල
ලියාපදිංචි කළ දිනය : 2010 ජූලි මස 16 දින

08-695

---

**නිවේදනයයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ අදිෂ්ක බියර් ෂොප් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම සීමාසහිත පෞද්ගලික සමාගමක් වශයෙන් වර්ෂ 2010 ක් වූ ජුනි මස 22 වැනි දින ලියාපදිංචි කරන ලදී.
සමාගමේ නම : අදිෂ්ක බියර් ෂොප් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 72800
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 8/1, වේලුවන පාර, දෙමටගොඩ, කොළඹ 09

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව,

කෝ - සර්ව් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

08-700

**නිවේදනයයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ ගලේනා වින්ඩ් එනර්ජි (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම සීමාසහිත පෞද්ගලික සමාගමක් වශයෙන් වර්ෂ 2010 ක් වූ ජුනි මස 04 වැනි දින ලියාපදිංචි කරන ලදී.
සමාගමේ නම : ගලේනා වින්ඩ් එනර්ජි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 72544
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 3/3, රොක්වුඩ් පෙදෙස, කොළඹ 07.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව,

කෝ - සර්ව් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

08-701

---

**නිවේදනයයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ ඩී ටූ හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම සීමාසහිත පෞද්ගලික සමාගමක් වශයෙන් වර්ෂ 2010 ක් වූ ජුනි මස 22 වැනි දින ලියාපදිංචි කරන ලදී.
සමාගමේ නම : ඩී ටූ හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 72799
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 182/2ඒ, ගාලු පාර, ගල්කිස්ස

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව,

කෝ - සර්ව් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

08-702

---

**නිවේදනයයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ එස්. ආර්. සෙල්වරාජ් ඇන්ඩ් සන්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම සීමාසහිත පෞද්ගලික සමාගමක් වශයෙන් වර්ෂ 2010 ක් වූ අප්‍රේල් මස 29 වැනි දින ලියාපදිංචි කරන ලදී.
සමාගමේ නම : එස්. ආර්. සෙල්වරාජ් ඇන්ඩ් සන්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 72091
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 40-42, 3/5, සිගුල් නිවාස සංකීර්ණය, ද ක්‍රෙස්ට් පෙදෙස, ඩුප්ලිකේෂන් පාර, කොල්ලුපිටිය

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව,

එච්. ඩී. සී. ඩී. විජේසිංහ,
නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් හා
ලියාපදිංචි ලේකම්.

08-703

---

**සියලු දෙනාගේම දැනගැනීම පිණිස**

මාතලේ, දෝල පාරේ, අංක 39 දරන ස්ථානයේ පදිංචි සමීන් අෂ්රෆ් නිසා (ජාතික හැඳුනුම්පත් අංකය 626762786 V) වන මා මෙයින් දන්වා සිටින්නේ ම විසින් 2005.05.30 වැනි දින ප්‍රංශ තානාපතිතුමා ඉදිරියේ ලියා අත්සන් තබන ලද අංක 32/2005 යටතේ වූ ඇටෝර්නි බලපත්‍රය ගම්පොල විදුහල පාරේ අංක 7/5 දරන ස්ථානයේ පදිංචි, සෙයියද් ෆරීද් ෆයිරෝස් ඉක්බාල් (ජාතික හැඳුනුම්පත් අංකය 571212362 V) නමැත්තා මාගේ විශේෂ ඇටෝර්නි බලකරු වශයෙන් පත්කර සිටියෙමි.

දැනට ඉහත නම් සඳහන් ගම්පොල විදුහල පාරේ අංක 7/5 දරන ස්ථානයේ පදිංචි සෙයියද් ෆරීද් ෆයිරෝස් ඉක්බාල් නැමැත්තාට පවරා තිබූ විශේෂ ඇටෝර්නි බලතලය වහාම ක්‍රියාත්මක වන පරිදි අද දින එනම් 2010.08.12 අවලංගු කරමි.

සමීන් අෂ්රෆ් නිසා,
(ජා. හැ. අංකය 626762786 V)

2010 අගෝස්තු මස 12 වැනි දින.

08-712

---

**ඇටෝර්නි බලපත්‍රයක් අවලංගු කිරීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ අංක 34, දුම්මලසූරිය ලිපිනයේ පදිංචි වර්ණකුලසූරිය බෙන්තරගේ සීතා රෝස් ඇලෙක්සැන්ඩර් වන මා දුම්මලසූරිය පොතුවටවන පදිංචි, ග්‍රාට් රංජනී ප්‍රනාන්දු යන අයට ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එම්. දේවිකා ප්‍රනාන්දු මහත්මිය විසින් ලියා සහතික කරන ලද

2006.05.19 දිනැති අංක 2268 දරන ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරමි.

වර්ණකුලසූරිය බෙන්තරගේ සීතා
රෝස් ඇලෙක්සැන්ඩර්.
(ඇටෝර්නි බලකරු)

08-620

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාර මෙම සමාගම, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලියාපදිංචි කර ඇති බැව් මෙයින් දන්වමි.
සමාගමේ නම : කෝමරන්ට් රිසෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය හා දිනය : පී. වී. 73438, 2010.07.27
ලියාපදිංචි ලිපිනය : අංක 07, කටුකුරුඳුවත්ත පාර, රත්මලාන

කන්සල්ටන්ට්ස් ඇන්ඩ් කෝපරේට්
සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

දුරකථන අංකය : 2689618.
08-626/1

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාර මෙම සමාගම, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලියාපදිංචි කර ඇති බැව් මෙයින් දන්වමි.
සමාගමේ නම : රිමාකෝ බේකර්ස් ඇන්ඩ් කේටරර්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ ලියාපදිංචි අංකය හා දිනය : පී. වී. 73173, 2010.07.13
ලියාපදිංචි ලිපිනය : අංක 287/ඒ, මාකොළ උතුර, මාකොළ

කන්සල්ටන්ට්ස් ඇන්ඩ් කෝපරේට්
සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්.
ලේකම්වරු.

දුරකථන අංකය : 2689618.
08-626/2

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාර මෙම සමාගම, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලියාපදිංචි කර ඇති බැව් මෙයින් දන්වමි.
සමාගමේ නම : වින්ට් පවර් සොලුෂන්ස් (පීවීටී)එල්ටීඩී
සමාගමේ ලියාපදිංචි අංකය හා දිනය : පී. වී. 73403, 2010.07.26
ලියාපදිංචි ලිපිනය : අංක 332/2, ගාලු පාර, කොළඹ 03

කන්සල්ටන්ට්ස් ඇන්ඩ් කෝපරේට්
සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

දුරකථන අංකය : 2689618.
08-626/3

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාර මෙම සමාගම, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලියාපදිංචි කර ඇති බැව් මෙයින් දන්වමි.
සමාගමේ නම : ඒ. එස්. ආර්. ඉන්පාස් ඉලෙක්ට්‍රික් සිස්ටම් ලංකා (පීවීටී) එල්ටීඩී
සමාගමේ ලියාපදිංචි අංකය හා දිනය : පී. වී. 73401, 2010.07.26
ලියාපදිංචි ලිපිනය : අංක 15/7බී, කර්නල් ටී. පී. ජයවර්ධන මාවත, කොළඹ 3

කන්සල්ටන්ට්ස් ඇන්ඩ් කෝපරේට්
සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

දුරකථන අංකය : 2689618.
08-626/4

---

**නිවේදනයයි**

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.
ලියාපදිංචි සමාගමේ නම : ඉන්ඩිගෝ ඉන්වෙස්ට්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 73242
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 6/1, නිදහස් මාවත, කොළඹ 07
ලියාපදිංචි කළ දිනය : 2010 ජූලි 16 දින

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස්,
(ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

08-633

---

**නිවේදනයයි**

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.
ලියාපදිංචි සමාගමේ නම : ඊ. එච්. පී. ෂෝෂල් හවුසිං (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 72992
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 660/7, අරලිය මාවත, ලියනගේ මුල්ල, සිදුව
ලියාපදිංචි කළ දිනය : 2010 ජූලි 02 දින

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස්,
(ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

08-634

---

**නිවේදනයයි**

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.
ලියාපදිංචි සමාගමේ නම : ද කොව් කෙටේජස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 73461
ලියාපදිංචි සමාගම් කාර්යාලීය ලිපිනය : අංක 540, ගාලු පාර, බලපිටිය
ලියාපදිංචි කළ දිනය : 2010 ජූලි 28 දින

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස්,
(ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

08-635

---

**නිවේදනයයි**

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.
ලියාපදිංචි සමාගමේ නම : එම්. එස්. ඒ. ෂම්සුඩීන් ලෙෂර් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 73479
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 09, කොලෙජ් ඇවනිව්, ගල්කිස්ස
ලියාපදිංචි කළ දිනය : 2010 ජූලි 29 දින

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස්,
(ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

08-636

---

**දැන්වීමයි**

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන අනුව පහත සඳහන් සමාගම ලියාපදිංචි කළ බව මෙයින් දැනුම් දෙමි.
නාමය : ජේ කිංග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 73138
දිනය : 2010.07.12
ලිපිනය : අංක 31/1 රිච්වේ පෙදෙස, කොළඹ 04

ආර්. රගුරාජා
ලේකම්.

2010 අගෝස්තු මස 12 වැනි දින.
08-638

---

**දැන්වීමයි**

කන්සල්ටන්ට්ස් ටුවෙන්ටිවන් (පබ්ලිකේෂන්ස්) ලිමිටඩ් 2010 ක් වූ ජූලි මස 16 වැනි දින, සංස්ථාපනය කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ නියමයන් ප්‍රකාර මෙයින් දැනුම් දී සිටිනු ලැබේ. එය සමාගම් ලියාපදිංචි අංක. P.B. 3845 දරන අතර එහි ලියාපදිංචි කාර්යාලය කොළඹ 10, විපුලසේන මාවත, අංක 167/4 දරන ස්ථානයේ වේ.

අධ්‍යක්ෂක.

08-583

---

**වගකීමෙන් සීමිත ප්‍රසිද්ධ සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනයයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීම පිළිබඳව අප විසින් මෙයින් නිවේදනය කර සිටිමු.
සමාගමේ නම : ග්‍රීනර් වෝටර් වන් එල්ටීඩී
සමාගමේ අංකය : පීබී 3858
සංස්ථාගත කිරීමේ දිනය : 2010.08.09
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ නැගෙනහිර කුලුණ, 27 වැනි මහල, ඉචෙලන් චතුරස්‍රය, කොළඹ 01.
ග්‍රීනර් වෝටර් වන් එල්ටීඩී සඳහා සහ වෙනුවෙන්,

පී ඩබ් කෝපරේට් සෙක්‍රටේරියල් (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරුන්.

08-668

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ කෙරෙන නිවේදනයයි.
01. සංස්ථාගත කළ දිනය : 2010 ජූලි 16
02. සමාගමේ නම : නිව් විංග්ස් ගෲප් (ප්‍රයිවට්) ලිමිටඩ්
03. සමාගමේ ලියාපදිංචි අංකය : පී. වී. 73239
04. ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 578/බී, විජිත මාවත, නාගොඩ, කළුතර.

ටී. එස්. පී. සිල්වා,
ලේකම්.

08-575

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.
සමාගමේ නම : ෆර්නිකෝ (පීවීටී) එල්ටීඩී
සමාගම් අංකය : පී. වී. 73213
සංස්ථාගත කළ දිනය : 2010 ජූලි 15
ලියපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 227/4, නිර්මාන මාවත, නාවල පාර, නුගේගොඩ.

අධ්‍යක්ෂ.

08-532

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.
සමාගමේ නම : අහම්රෝසා ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී. වී. 72542
සංස්ථාගත කළ දිනය : 2010 ජූනි 03
ලියපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 59 1/1, හයිලෙවල් පාර, කිරුළපන, කොළඹ 06.

අධ්‍යක්ෂ.

08-552/1

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.
සමාගමේ නම : ග්ලොබල් ජන්ෂන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී. වී. 73142
සංස්ථාගත කළ දිනය : 2010 ජූලි 13
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 59 1/1, හයිලෙවල් පාර, කිරුළපන, කොළඹ 06.

අධ්‍යක්ෂ.

08-552/2

---

**සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම**

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9(1) වැනි වගන්තිය යටතේ මහජනයා වෙත කරන දැන්වීමයි.
සමාගම් නාමය : පීරාපැට් ක්ලීනිං ටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 71129
ලියාපදිංචි කළ දිනය : 2010.02.18
කාර්යාල ලිපිනය : නො. 291/32 ඒ, හැව්ලොක් උද්‍යානය හැව්ලොක් පාර, කොළඹ 05.

එල්. එම්. මැනේජ්මන්ට් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්.
ලේකම්වරු.

08-610

---

**සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම**

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9(1) වැනි වගන්තිය යටතේ මහජනයා වෙත කරන දැන්වීමයි.
සමාගම් නාමය : කැළණි යුනි ඉන්ෂුරන්ස් බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 73170
ලියාපදිංචි කළ දිනය : .2010.07.13
කාර්යාල ලිපිනය : අංක 291/32 ඒ, හැව්ලොක් උද්‍යානය, හැව්ලොක් පාර, කොළඹ 05.

එල්. එම්. මැනේජ්මන්ට් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්.
ලේකම්වරු.

08-611

---

**සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම**

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9(1) වැනි වගන්තිය යටතේ මහජනයා වෙත කරන දැන්වීමයි.
සමාගම් නාමය : එස්. ජේ. ඕෂන් වර්ල්ඩ් ප්‍රයිවට් ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 72665
ලියාපදිංචි කළ දිනය : 2010.06.11
කාර්යාල ලිපිනය : අංක 54, ආනන්ද කුමාරස්වාමි මාවත, කොළඹ 07.

එල්. එම්. මැනේජ්මන්ට් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්.
ලේකම්වරු.

08-612

---

**සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම**

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9(1) වැනි වගන්තිය යටතේ මහජනයා වෙත කරන දැන්වීමයි.
සමාගම් නාමය : එස්. එන්. ජේ. ෆෑඩ්ස් ප්‍රයිවට් ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 72666
ලියාපදිංචි කළ දිනය : 2010.06.11
කාර්යාල ලිපිනය : නො. 54, ආනන්ද කුමාරස්වාමි මාවත, කොළඹ 07.

එල්. එම්. මැනේජ්මන්ට් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්.
ලේකම්වරු.

08-613

---

**සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම**

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9(1) වැනි වගන්තිය යටතේ මහජනයා වෙත කරන දැන්වීමයි.
සමාගම් නාමය : එස්. ජේ. ඇග්‍රෝ වර්ල්ඩ් ප්‍රයිවට් ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 72664
ලියාපදිංචි කළ දිනය : 2010.06.11
කාර්යාල ලිපිනය : නො. 54, ආනන්ද කුමාරස්වාමි මාවත, කොළඹ 07.

එල්. එම්. මැනේජ්මන්ට් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්.
ලේකම්වරු.

08-614

---

**සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම**

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9(1) වැනි වගන්තිය යටතේ මහජනයා වෙත කරන දැන්වීමයි.
සමාගම් නාමය : කෙයාවොෂ් ප්‍රයිවට් ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 70721
ලියාපදිංචි කළ දිනය : 2010.01.15
කාර්යාල ලිපිනය : නො. 29/41, කෙළඹගේ මාවත, කොළඹ 05.

එල්. එම්. මැනේජ්මන්ට් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්.
ලේකම්වරු.

08-615

---

**සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම**

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9(1) වැනි වගන්තිය යටතේ මහජනයා වෙත කරන දැන්වීමයි.
සමාගම් නාමය : ජේ. ඩබ්ලිව්. ලෙෂර් ප්‍රයිවට් ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 71885
ලියාපදිංචි කළ දිනය : .2010.04.10
කාර්යාල ලිපිනය : අංක 193, පෝරුතොට පාර කොච්චිකඩේ.

එල්. එම්. මැනේජ්මන්ට් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්.
ලේකම්වරු.

08-616

---

**ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම**

කොළඹ දිස්ත්‍රික්කයේ කැලණිය, දලුගම, අංක 720/R හි පදිංචි රණසිංහ අරච්චිගේ ප්‍රමුද් බුද්දික වන මම, මගේ ඇටර්නි බලකරු ලෙස ඇබිලිපිටිය, උඩගම, දර්ශණගම, අංක 1924 හි පදිංචි අබේසිංහ කන්කානාමිගේ ඉන්ද්‍රා මල්කාන්ති පත් කරමින් දකුණු කොරියානු ජනරජයේ චෝ මූ හී නොතාරිස් තැන ලියා සහතික කරන ලද 2009.09.04 වැනි දිනැති ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බවත්, ඒ මත මගේ ඇටර්නි බලකරු ලෙස පත් කල අබේසිංහ කන්කානාමිගේ ඉන්ද්‍රා මල්කාන්ති යන අය මින් මතුවට මාගේ ඇටර්නි බලකරු ලෙස ක්‍රියා නොකරන බවත් මින් මතුවට එකී ඇටර්නි බලපත්‍රය මත ඇය කරනු ලබන කිසිදු ක්‍රියාවක් අපගේ ක්‍රියාවක් ලෙස නොසලකන බවත් ශ්‍රී ලංකා වාසි සියලු දෙනා වෙත මෙයින් දන්වා සිටිමි.

මීට,
රණසිංහ අරච්චිගේ ප්‍රමුද් බුද්දික.

08-578

---

**ඇටර්නි බලපැවරුම අවලංගු කිරීම**

එක්සත් රාජධානියේ ලන්ඩන් එච් ඒ ඕ 3 ඒ ටී වෙම්බ්ලි සඩ්බරි ටවුන් ඊටන් ඇව්නියු අංක 118 හි සම්පන්තමූර්ති ජයකුමාර් වන මා විසින් අංක 1336 දරන හා 2003.08.23 වැනි දිනැති කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. කනේෂයෝගන් විසින් ලියා සහතික කරන ලද ඇටර්නි බලපැවරුම මත කොළඹ 04, කාසල් පටුමගේ, අංක 9 ඒ හි පදිංචි, මුරලිදරන් පන්චනාදන් වෙත පවරා තිබූ සියලුම බලතල මෙයින් අවලංගු කරනු ලැබේ.

සම්පන්තමූර්ති ජයකුමාර්,

08-724

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - නුගේගොඩ ශාඛාව**
**(දැනට හැටන් නැෂනල් බැන්ක් පී එල් සී යනුවෙන් හඳුන්වනු ලබන)**
**1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන ) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම පිළිබද දැන්වීම**

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. බී. පෙරේරා විසින් 2007.05.15 වැනි දින හැටන් නැෂනල් බැන්ක් පී එල් සී නමට ලියා සහතික කරන ලද අංක 3122 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම නානයක්කාර කුඩා හෙට්ටිගේ රසික ලසන්ත පෙරේරා යන අය බන්ධනදායි ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී ණය මුදලද ඒමත අයවිය යුතු නෛතික පොළියද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලැබූ වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද ඇතුළු සියලු මුදල් අයකර ගැනීම සඳහා,

ඉහත කී හැටන් නැෂනල් බැන්ක් පී එල් සී ආයතනය මා වෙත පවරා ඇති බලතල අනුව පහත විස්තර කර ඇත්තා වූ ද, දේපළ වර්ෂ 2010 ක් වූ සැප්තැම්බර් මස 21 වැනි දින ප.ව 1.30 ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ මැදපත්තුවේ හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ මාදිවෙල ගමේ 1 වැනි පටුමගේ තලපත්මිටිය වරිපනම් අංක 2 හි දෙල්ගහවත්ත දරන ඉඩමට බලයලත් මානක එම් එල් එන් පෙරේරා විසින් මැන සාදන ලද 2002.05.16 වැනි දින සහ අංක 1966 දරන පිඹුරේ ලොට් අංක ඒ දරන කොටස.

ප්‍රමාණය : පර්චස් දහයයි දශම පහක් (අ. 0 රූ. 0 පර්. 10.5)

මේ පිළිබද යෝජනා සම්මුතිය 2009.07.17 වැනි දින *ගැසට් පත්‍රයේ* සහ 2009.07.29 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පත්‍රවල පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැනුම්කරු විසින් පහත සදහන් ගෙවිම් මුදලින් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

(1) ගැනුම් මිලෙන් සියයට දහයක් (10%) ක්,
(2) ප්‍රාදේශීය සභා බදු සියයට එකක් (1%) ක්,
(3) සියලුම ප්‍රචාරක වියදම්,
(4) වෙන්දේසිකරුගේ වෘත්තීය ගාස්තු (ගැණුම් මිලෙන් 25%),
(5) මුද්දර ගාස්තු,
(6) විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු,
(7) ලිපිකරු හා සෝෂක ගාස්තු.

ගැනුම් මිලෙන් ඉතිරි සියයට අනූවක් (90%) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී එල් සී ආයතනයට ගෙවිය යුතු අතර, එසේ නොවුනහොත් ඒ වන විට ගෙවා ඇති මුදල් අහිමි කිරීමට සහ එම දේපළ නැවත වෙන්දෙසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු තිරප්පු පරීක්ෂාව සදහා ජ්‍යෙෂ්ඨ කළමණාකරු, (ණය අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී එල් සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10. දුරකථන අංක : 2661835- 2661826 යෙන් ලබාගත හැක.

හේමචන්ද්‍ර දළුවත්ත,
උසාවි කොමසාරිස්, බලයලත් වෙන්දේසිකරු
සහ තක්සේරුකරු.

අංක 99, උසාවිය පාර, කොළඹ 12.
දුරකථන අංකය : 071 -4175944, 075-8489378.
08-723

---

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - හෙට්ටිවීදිය ශාඛාව**
**(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව යනුවෙන් හඳුන්වනු ලැබූ)**
**1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම**

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් 2008.05.29 වැනි දින ලියා සහතික කරන ලද අංක 3176 දරන බැඳුම්කරය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියා සහතික කරන ලද බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සෙල්ලමුත්තු රවීන්ද්‍රන් යන අය බන්ධනදායී ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, එකී ණය මුදල් සහ ඒ මත අයවිය යුතු නෛතික

පොළිය සහ වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළු සියලු මුදල් ප්‍රමාණයන් ද (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල අඩුකොට) අයකර ගැනීම සඳහා ඉහත කී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී ආයතනය මා වෙත පවරා ඇති බලතල අනුව පහත විස්තර කර ඇත්තාවූ ද දේපළ වර්ෂ 2010 ක් වූ සැප්තැම්බර් මස 20 වැනි දින පෙ.ව. 11 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ පල්ලේ පත්තුවේ, බම්බලපිටිය කලින් පෙන්ඩන්නිස් ඇවනියු හි අංක 38 වසමට අයත් දැනට අබ්දුල් ගපූර් මාවත වරිපනම් අංක 1217 දරන පෙන්ඩන්නිස් හෙවත් ශ්‍රීනිකේත නමැති ඉඩමට බලයලත් මානක එස්. ගුණවර්ධන විසින් මැන සාදන ලද 1982.02.09 වැනි දින දරන පිඹුරේ බෙදා වෙන් කරන ලද කැබලි අංක 5 දරන කොටස. ප්‍රමාණය : පර්චස් හතකි. (අ. 0, රූ. 0, පර්. 7).

*පිවිසීම.-* ගාලු පාර හන්දිය සහ කොල්ලුපිටිය අබ්දුල් ගපූර් මාවතේ මීටර් හැත්තෑපහක් ගමන් කොට දකුණට හැරී අඩි 20ක් පමණ පළල පුද්ගලික පාරේ මීටර් 35 ක් පමණ ගමන්කොට එම පාර අවසානයෙන් දකුණට හැරී අඩි 10 ක් පළල පාරෙන් මීටර් 10 ක් පමණ ගමන් කිරීමේ දී මෙම දේපළට ළඟාවිය හැක. මෙම දේපළ ආර්. ඒ. ද මැල් මාවතට මීටර් 125 ක් පමණ දුරින් පිහිටා ඇත.

මේ පිළිබඳ යෝජනා සම්මුතිය 2009.08.21 වැනි දින *ගැසට් පත්‍රයේ* සහ 2009.08.20 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පත්‍රවල පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ :

1. ගැනුම් මිලෙන් සියයට දහයක් (10%),
2. ප්‍රාදේශීය සභා බදු සියයට එකක් (1%),
3. සියලුම ප්‍රචාරක වියදම්,
4. වෙන්දේසිකරුගේ වෘත්තීය ගාස්තු (ගැණුම් මිලෙන් 2.5%),
5. මුද්දර ගාස්තු,
6. විකුණුම් කොන්දේසි පිළියෙල කිරීමේ හා නොතාරිස් ගාස්තු,
7. ලිපිකරු හා සෝෂක ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී ආයතනයට ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වන විට ගෙවා ඇති මුදල් ආපසු නොගෙවන අතර එම දේපළ නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු තිරප්පු පරීක්ෂාව සඳහා ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අයකිරීම්), හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත කොළඹ 10 - දුරකථන අංක : 2661826, 2661835 න් ලබා ගත හැක.

හේමචන්ද්‍ර දළුවත්ත,
උසාවි කොමසාරිස්, බලයලත් වෙන්දේසිකරු,
සහ තක්සේරුකරු.

අංක 99, උසාවිය පාර,
කොළඹ 12,
දුරකථන අංකය : 071-4175944, 075-8489378.

08-722

---

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

ආර්. එම්. සි. එම්. ඒ. රත්නායක,
ගිණුම් අංක : 0056 5000 5912.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2008 ජූලි 24 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් විසි එක් ලක්ෂ අනූ දෙදහස් පන්සිය විසි තුනයි ශත හැට නමයක (රු. 21,92,523.69) මුදලද 2008 අප්‍රේල් 30 වැනි දින සිට අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දහ නම ලක්ෂ හැට එක් දහස් අටසිය පනස් එකයි ශත හයක (රු. 19,61,851.06) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි එකක් (21%) බැගින් වූ පොලියද, දැන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තුද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2009.09.25 දින *රජයේ ගැසට් පත්‍රයේ*, 2009.09.25 දින දිවයින සහ තිනකුරල් සහ අයිලන්ඩ් දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි .2010.09.24 දින පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේදී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**ඉහත කී උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර උඩගම්පහ කෝරලේ පාතදුම්බර ප්‍රාදේශීය සභා සීමාවන් තුළ නාපන ග්‍රාමයේ පිහිටි අබුදූව නොහොත් "අරඹේකොටුව" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ටී. බී. අත්තනායක යන අය විසින් සාදන ලද 2000 නොවැම්බර් 02 දාතම හා අංක 7942 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, ඊසානට : කුට්ටිය කුඹුරේ වෙල්යාය ගිණිකොණට : අරඹේ කොටුව නිරිතට : ප්‍රධාන පාරේ සිට නිවාස දක්වා පාර සහ වයඹට: පාන මල්දෙණියේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් තුනයි පර්චස් හතක් (අ. 0 රූ. 3 පර්. 7) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොල වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 7942 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව ඊ 695/246 යටතේ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

08-715

---

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ඩබ්ලිව්. ඩබ්ලිව්. එම්. ආර්. එන්. එස්. බී. කඹුරදෙණිය සහ ආර්. එම්. බී. මැණිකේ
ගිණුම් අංක : 0006 5003 9084.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2007ක් වූ සැප්තැම්බර් මස 28 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හැට එක් ලක්ෂ විසිදහස් තුන්සිය විසි දෙකයි ශත හැත්තෑ තුනක (රු. 61,20,322.73) මුදලද 2009 ජූනි 11 දින සිට බැඳුම්කර අංක 72 මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පනස් තුන් ලක්ෂ අනූ හය දහස් හාරසිය හැත්තෑ නමයයි ශත අනූ නමයක (රු. 53,96,479.99) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහඅටක් (18%) බැගින් වූ පොලියද හා ප්‍රචාරණ වියදම් ද දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2009.06.26 දින රජයේ *ගැසට් පත්‍රයේ*, 2009.03.24 දින " දිවයින" "අයිලන්ඩ්" සහ "තිනකුරල්" දිනපතා ප්‍රවෘත්ති පත්‍ර වල පළකොට ඇති පරිදි 2010.09.23 වැනි දින පෙ. ව. 9.30 ට පිහිටි ස්ථානයේදී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙණිය හත්පත්තුවේ රෙකොපත්තු කෝරලේ වේවැල්පොල ග්‍රාමයේ පිහිටි ප්‍රමාණයෙන් කුරක්කන් ලාහ තුනක් පමණ වපුරන "ගලගාවහිටින වත්ත" යයි කියනු ලබන ඉඩම් කොටසට මායිම් උතුරට : අවුසදහාමිගේ ඉඩම, නැගෙනහිරට: රන්හාමිගේ ඉඩමේ එඬරු වැට, දකුණට : රන්හාමිගේ ඉඩම සහ පුංචිරාළ විදානේගේ ඉඩම සහ බස්නාහිරට : හිටපු නිලධාරි අප්පුහාමිගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ඉහත ඉඩම් කොටස සමග වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග වෙළුම/පත්ඉරුව එෆ් 1179/238 යටතේ කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී වේවැල්පොල ග්‍රාමයේ පිහිටි "ගලගාවහිටින වත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. එම්. ආරියරත්න යන අය විසින් සාදන ලද 1998 පෙබරවාරි 27 දාතම හා අංක 98/53 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 01 වශයෙන් නිරූපිත සහ ඉන් අනතුරුව මැන ඇති එකී ඉඩමට ඉහත පිඹුරට අනුව මායිම් උතුරට ඒ. එම්. ගුණතිලක සහ වෙනත් අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ විජේරත්න බණ්ඩා සහ වෙනත් අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම, නැගෙනහිරට : එච්. එම්. ඥාණවතී යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම දකුණට : අඹහේන සිට පිදුරුවෙල්ල දක්වා ගම්සභා පාර නිරිතට : එච්. එම්. ඥාණවතී යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ බස්නාහිරට : ඒ. එම්. එන්. කුමාරිහාමි සහ වෙනත් අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම යන මායිම් තුල පිහිටි ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් එකයි පර්චස් දෙකක් (අ. 1 රූඩ් 1 පර්. 02) විශාල ඉඩම ඉහත කී පිඹුරට අනුවය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

08-716/6

---

**මහජන බැංකුව - මාතර උයන්වත්ත ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත 2010.09.17 දින පෙ.ව. 10.30 ට මෙහි පහත විස්තර වන දේපොළ එකී දේපොළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

***උකස් කර ඇති දේපොළ පිළිබඳ විස්තරය :***

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, දික්වැල්ල, වත්තේගම දකුණ, පිහිටි මාතර පාරේ වරිපනම් අංක 95 දරන කහවත්තෙගෙවත්ත නමැති ඉඩමට ජී. 7880 බෙදුම් නඩුව ප්‍රකාර එකී නඩුවට ගොනු කර ඇති අංක 3028 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කල අංක 02 දරන කැබැල්ලේ කොටසක් සහ අංක 03 දරන කැබැල්ල ද, ඒකාබද්ධව සෑදූ 1996.01.28 දිනැති බී. ජී. කරුණාදාස මිහින්දෝරු මහතාගේ අංක 1032 දරන පිඹුරේ පිළිබිඹු කර ඇති ඉඩම් කැබලි දෙකෙන් අංක 03 දරන කැබැල්ලෙන් බෙදූ අංක : 02 දරන පර්චස් පහලොවක් (අක් 0, රූ. 0, පර්. 15) විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි ගොඩනැගිලි ආදී සියළු දෙය ද වේ.

වැඩි විස්තර සඳහා 2008.11.14 දින රජයේ *ගැසට් පත්‍රයේ* ද 2009.02.13 දින "දිනමින", පුවත්පතේ ද පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපොළට පිවිසීමේ මාර්ගය.-* මාතර, දික්වැල්ල ප්‍රධාන මාර්ගය, දික්වැල්ල, බෙලිඅත්ත නව මාර්ගය අසලින් වම් පසට වැටී ඇති අතුරු මාර්ගයේ මීටර් 75 පමණ ගියවිට පාරට මායිම්ව මෙම දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය :-

1. ගැණුම් මිලෙන් 10% ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට විකුණුම් මිළෙන් 1% ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක් ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක් ද,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල ද,
6. විකුණුම් සහතිකය හා මුද්දර ගාස්තු ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුළත මාතර, නූපේ, අනගාරික ධර්මපාල මාවතේ අංක : 215 දරන ස්ථානයේ පිහිටි මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ, ප්‍රාදේශීය කළමනාකාර මහතාට ගෙවිය යුතුය.

දුරකථන අංක : 041-2222792, 2222822 හා 2224773,
ෆැක්ස් අංක : 041-2222688.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත කී ලිපිනයෙන් ලබා ගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30 ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිලෙන් ගෙවා ඇති 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ජී. පී. ආනන්ද (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත,
වල්ගම, මාතර.
දුරකථන අංක : 041-2228731, 071-4438516.

08-629

---

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - බුත්තල ශාඛාව**

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බණ්ඩාරවෙල ප්‍රසිද්ධ නොතාරිස් එම්. සී. ජේ. පීරිස් විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දා වූ ද 2006.11.17 දින අංක 14492 දරන බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම සූරියගේ චාර්ලිස් සහ ශමින්ද වික්‍රමතුංග සෙනෙවිරත්න යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුලුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපල එම දේපල පිහිටි ස්ථානයේදී 2010 ක් වූ සැප්තැම්බර් මස 15 වැනි දින ප.ව. 2.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපල.-* ඌව පළාතේ මොණරාගල දිස්ත්‍රික්කයේ කතරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බුත්තල කෝරළේ, සෙල්ල කතරගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ සෙල්ල කතරගම පිහිටි රජයේ ඉඩමට සර්වේ ජනරාල් විසින් මැන සාදන ලද පිඹුරු අංක එෆ්ටීපී 25 ලොට් 41 නමැති ඉඩම සහ එහි ඇති සියලු දේත් වේ. විශාලත්වය හෙක්ටයාර 1.709 වේ.

ඉහත ඉඩම බලයලත් මානක ආර්. එම්. පී. ඩී. සිල්වා විසින් 2006.04.30 දින නැවත මැනීමකට අනුව අංක 267 බී පිඹුර ප්‍රකාර හේකටයාර් 1.709 ක් හෝ අක්කර 4 පර්චස් 35.7 ක් වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2010.07.09 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2010.07.09 දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.-* බුත්තල හන්දියේ සිට රජ මාවතේ (කතරගම පාරේ) සෙල්ලකතරගම දක්වා කි. මී. 36.85 ක් ගමන් කර ලක්ෂ්මී දේවාලයට දිවෙන පාරේ පාලමට මෙපිටින් ඇති පාරෙන් දකුණට හැරී මීටර් 50 ක් පමණ ගොස් වමට හැරී කි. මී. 1.6 ක් ගියවිට මාර්ගරක්ෂිතයේ දකුණු මායිමේ ඇති මෙම දේපල හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය :-

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු.2000) ක් ද,
5. ලිපිකරුසහ සෝෂක ගාස්තු රුපියල් පන්සීය (රු.500) ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු සහ ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී අංක 479, ටී. බී. ජායා මාවත, කොළඹ 10. (දුරකථන අංක : 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 156- 1/13,
උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක : 0777-378441
0174-424478,
ෆැක්ස් අංකය : 0114-617059.

08-639

---

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - වැල්ලවාය ශාඛාව**

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බණ්ඩාරවෙල ප්‍රසිද්ධ නොතාරිස් එම්. කේ. ලියනගේ විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දා වූ ද 2002.02.13 දින අංක 372 දරන බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම රාජපක්ෂ මුදියන්සේලාගේ චන්දන තිලක් රාජපක්ෂ සහ රාජපක්ෂ මුදියන්සේලාගේ පුංචි බණ්ඩා රාජපක්ෂ යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපල එම දේපල පිහිටි ස්ථානයේදී 2010 ක් වූ සැප්තැම්බර් මස 15 වැනි දින පෙ.ව. 9.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපල:* ඌව පළාතේ මොණරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය කෝරළේ, වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සීමාවේ වේරහැර ජනපදයේ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වැල්ලවාය ප්‍රාදේශීය සභා සීමාවේ වෙහෙරයාය ජනපදයේ පිහිටි ඉඩමට සර්වේ ජනරාල් විසින් ලියා සහතික කරන ලද 1964 අප්‍රේල් සිට 1965 අප්‍රේල් දිනැති ටී. ඕ. පී. ඕ. පී. පී. 70 එම් ඕ/94/4957 පිඹුර ප්‍රකාර ලොට් අංක 632 ලෙස ලකුණු කර බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස සහ එහි ඇති සියලු දේත් වේ. විශාලත්වය අක්කර 3, රූඩ් 3, පර්චස් 36 වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2010.06.04 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2010.06.09 වැනි දින අයිලන්ඩ් දිවයින සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.-* වැල්ලවාය නගරයේ සිට කි. මී. 9 ක් පමණ ගිය තැන (කි. මී. 9 කණුවට මීටර් 20 ක් මෙපිටින්) දකුණු පැත්තට හැරෙන පාර හමුවේ. එම පාරේ කි. මී. 1 ක් පමණ ගිය තැන වම් අත පැත්තට හැරෙන ගුරු පාර හමුවේ. එම ගුරු පාරේ මීටර් 200 ක් ගියවිට, පාරට මුහුණලා ඇති විෂය වස්තුව හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසි අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය :-

1. ගැණුම් මිලෙන් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු.2000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සීය (රු.500) ක් ද
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහය (10%) මුදල අහිමි කිරීමට සහ දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු සහ ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අධීක්ෂණ සහ අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී අංක 479 ටී. බී. ජායා මාවත, කොළඹ 10. (දුරකථන අංක : 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු සහ
බලයලත් වෙන්දේසිකරු.

අංක 156- 1/13,
උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක : 0777-378441,
0714-424478,
ෆැක්ස් අංකය : 0114-617059.

08-640

---

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - නුගේගොඩ ශාඛාව**

(කලින් සීමා සහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

1990 අංක 04 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වෙනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපල පහත දැක්වෙන දිනයන්හි හා වේලාවන්හිදී දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

1. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පේ පත්තුවේ මීපේ හප්පාවන පිහිටි පොඩ්ඩුගොඩවත්ත සහ යාගල්දූවෙවත්ත සහ බෝගහකොරටුව නොහොත් හොම්පලවත්ත නමැති ඉඩමේ යාබදව පිහිටි ලොට් 13 සහ 15 මත පිහිටි බලයලත් මානක ඒ. ආර්. වීරසූරිය විසින් මැන සාදන ලද අංක 42 සහ 1986 අප්‍රේල් 20 දිනැති සැලැස්මේ ලොට් 2 වශයෙන් බෙදා වෙන් කොට සීමා නිර්ණය කර ඇති ඉඩම එහි පස, ගහකොළ පලතුරු වැවිලි සහ එහි තුල පිහිටි ගොඩනැගිලි ආදී සියල්ල වේ. (ප්‍රමාණය අ. 0, රූ. 1, පර්. 13.8) 2010 සැප්තැම්බර් මස 13 දින පෙරවරු 11.30 ට

2. දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ ගාල්ල කඩවත් සතර තුල ගාල්ල මහ නගර සභා සීමාව තුල මිනුවන්ගොඩ පිහිටි එක් ඉඩමක් ලෙස සලකනු ලබන අන්නාසිබැරැක්කේවත්ත, පින්නවත්ත කුඹුරේ බෙදා වෙන් කරන හතරෙන් එක් පංගුව සහ බෝම්සීයාවත්ත නමැති ඉඩම්වලට බලයලත් මානක ටී. ජේ. අරම්බෙවෙල විසින් මැන සාදන ලද අංක 1470 සහ 1999.01.01 දිනැති සැලැස්මේ ලොට් එක්ස් වශයෙන් බෙදා වෙන් කොට සීමා නිර්ණය කර ඇති ඉඩම එහි පස, ගහකොළ පලතුරු වැවිලි සහ එහි තුල පිහිටි ගොඩනැගිලි ආදී සියල්ල වේ. (ප්‍රමාණය අ. 0, රූ. 0, පර්. 31.1) 2010 සැප්තැම්බර් මස 13 දින පස්වරු 2.30 ට

3. දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ ගාල්ල කඩවත් සතර තුල දෙද්දුගොඩ පිහිටි ජම්බුගහවත්ත, පස්හවුල්ඹිවිට සහ හික්ගහවත්ත යන ඉඩම්වලින් සමන්විත එගර්ටන්වත්ත ලොට් 2 දරන ඉඩමට බලයලත් මානක කේ. ඩබ්ලිව්. පතිරණ විසින් මැන සාදන ලද අංක 1294 සහ 1996.10.06 දිනැති සැලැස්මේ ලොට් 5 වශයෙන් බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති ඉඩම එහි පස, ගහකොළ, පලතුරු වැවිලි සහ එහි තුල පිහිටි සියල්ල වේ. (ප්‍රමාණය : අ. 0, රූ. 0, පර්. 14.44) 2010 සැප්තැම්බර් මස 14 දින පෙරවරු 11.3 0 ට.

4. ඉහත කී දෙද්දුගොඩ පිහිටි ජම්බුගහවත්ත, පස්හවුල්ඹිවිට සහ හික්ගහවත්ත යන ඉඩම්වලින් සමන්විත එගර්ටන්වත්ත වත්තේ ලොට් 2 දරන ඉඩමට බලයලත් මානක කේ. ඩබ්ලිව්. පතිරණ විසින් මැන සාදන ලද අංක 1294 සහ 6/10/1996 දිනැති සැලැස්මේ ලොට් 9 වශයෙන් බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති ඉඩම (ප්‍රමාණය : අ. 0, රූ. 0. පර්. 13.15) 2010 සැප්තැම්බර් මස 14 දින පස්වරු 2.30 ට අරුණ ඩිස්ට්‍රිබියුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනාදායියන් වශයෙන් සහ අරුණ ලසන්ත විජේවික්‍රම (බන්ධනාදායියාගේ අධ්‍යක්ෂවරයෙක්) උකස්කරු වශයෙන් ද සියල්ලම ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. එස්. මරික්කාර් විසින් ලියා සහතික කරන ලද අංක 10759 සහ 2008.05.09 අංක 10761 සහ 2008.05.12 සහ අංක 10791 සහ 2008.06.19 දිනැති උකස්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය.- සඳහා 2009.12.02 වන දින ලක්බිම සුඩර් ඔලි පුවත්පත් සහ 2009.12.03 ඩෙයිලි නිවුස් පුවත්පත ද 2009.11.20 වන දින *ගැසට් පත* ද බලන්න.

**දේපළට පිවිසෙන මාර්ගය**

1. ගාල්ල නගර මධ්‍යයේ සිට මාතර පාර දිගේ කිලෝමීටර් 4 ක් පමණ දෙවට හන්දියෙන් වම්පස අකුරැස්ස පාරට පිවිස කිලෝමීටර 8 ක් පමණ ගොස් පිලාන හන්දියෙන් දකුණු පස හප්පාවන පාරට හැරී මීටර් 600 ක් පමණ ගොස් වම්පස මත්තේගොඩ පාරට පිවිස මීටර 150 ක් පමණ ගිය විට විකිණීමට නියමිත ඉඩම හමුවේ.

2. ගාලු නගරයේ සිට වක්වැල්ල පාර දිගේ කිලෝමීටර් 1.3 පමණ ගොස් වක්වැල්ල පාරේ අංක 240 පරිශ්‍රය දක්වා ගොස් එකී පරිශ්‍රය පසු කළ වහාම දකුණු පස නගර සභා පාරට හැරී මීටර් 30 පමණ ගමන්කර වම්පස අඩි 15 පළල පාරට හැරී මීටර් කීපයක් ගමන් කළ විට දී විකිණීමට නියමිත වක්වැල්ල පාරේ අංක 244 දරන ඉඩම හමුවේ.

3/4. ගාල්ල බස් නැවතුමේ සිට බැද්දේගම පාර දිගේ කිලෝමීටර් 3 ක් පමණ ගොස් බෙලිගහ හන්දිය දෙසට යන විට බෙලිගහ හන්දියට මීටර් 100 ක් පමණ ඔබ්බෙහි දකුණු පස දිදෙස්වත්ත නමැති නගර සභා පාරට පිවිස මීටර් 200 ක් පමණ ගොස් මොරගල ඇල පාලම තරණය කොට වම්පස ඇල බැන්ක් පාරට හැරී මීටර් 250 ක් පමණ ගිය විට හමුවන දකුණු පස පිහිටි අඩි 20 ක් පළල පාර දිගේ මීටර් 125 ක් පමණ ගිය විට පාරේ වම් පස විකිණීමට නියමිත ඉඩම හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවලේම පහත සඳහන් මුදල් වෙන්ද්සිකරුට ගෙවිය යුතුය.

1. ගැනුම් මිලෙන් 10% ක් ද (සියයට දහයක්),
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ක් (සියයට එකයි) සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2%ක් (සියයට දෙකහමාරක්),
4. ප්‍රචාරක වියදම් ද,
5. ලිපිකරු සහ සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30 ක් ඇතුළත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතුය. එකී 90% ඉතිරි මුදල දින 30 ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% මුදල අහිමි කිරීමට හා එකී දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාළ තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකරු නීති පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී ප්‍රධාන කාර්යාලය අංක 450, ගාලු පාර, කොළඹ 03, දුරකථන අංක : 2565573/2565565.

ශ්‍රියානි මනම්පේරි,
උසාවි කොමසාරිස්, බලයලත් වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ තැරැව්කරු,

එම්. එස්. ඔක්ෂන්ස්,
අංක 09, බෙල්මන්ට් වීදිය,
කොළඹ 12,
දුරකථන අංක : 011-2320074 සහ 0713-151356.
08-714/2

---

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - බොරැල්ල ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පදිංචියට සුදුසු වටිනා දේපලක්.- බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ නාරාහේන්පිට වසම් අංක 34 හි වැලිකඩ පිහිටි බොරැල්ල දොස්තර එන්. එම්. පෙරේරා මාවතේ (කලින් කොටා පාර) වරිපනම් අංක 280 දරන පෙලෙන්ගහවත්ත නොහොත් "ගොරකගහවත්ත" නමැති ඉඩමට බලයලත් මානක එම්. සී. එල්. සී. පෙරේරා විසින් මැන සාදන ලද අංක 28/2000 සහ 2000.08.31 දිනැති පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස වන ප්‍රමාණයෙන් අක්කර බිංදුවයි රූඩ් බිංදුවයි පර්චස් හයයි දශම බින්දුවයි දෙක (අ. 0, රූ. 0, පර්. 6.02) ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි සහ අනිකුත් සියළු දේ ද වේ.

මෙම දේපල දිනෝෂා හෙට්ටිආරච්චි යන අය ණයකරු හැටියට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙතින් ලබා ගන්නා ලද ණය මුදල වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් සහතික කරන ලද්දා වූ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දා වූද 2006.06.29 සහ 2007.06.19 වන දින සහ පිළිවෙලින් අංක : 2735 හා 2937 දරන බැදුම්කරයන් යටතේ බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපලට පිවිසීම.-*මෙම ඉඩම ඍජු කෝණාස්‍රාකාර හැඩයෙන් යුක්තය. කෝට්ටේ පාරට අඩි 20 ක් පමණ මුහුණලා ඇත. එය පාරක් සමගම සම මට්ටමේ පිහිටා ඇති ඉඩමකි. මාර්ග සීමාව විවෘතව ඇති අතර අනිකුත් සීමාවන් ලකුණු කර ඇත්තේ පසුපස තාප්පයකින් සහ එකට යා කොට ඇති ගොඩනැගිලිවල බිත්ති වලින්ය.

හැටන් නැෂනල් බැංකුවෙන් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් වර්ෂ 2010 ක් වූ සැප්තැම්බර් මස 16 වන දින පෙ.ව. 11.30 ට දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා.- 2010.01.22 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද 2010.01.22 වැනි දින ද අයිලන්ඩ් දිවයින තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.-* විකිණීම ස්ථිර කළ වහාම ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකක්),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්),
4. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, සහ සියළුම ප්‍රචාරක වියදම් ද,
5. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීමේ සඳහා රු. 2,000.

ගැනුම් මිලෙන් ඉතිරි 90% ක් (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුලත දී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතු වේ. එකී 90% ඉතිරි මුදල දින 30 ක් ඇතුලත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත. හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : ප්‍රධාන කළමනාකරු (අයකිරීම් අංශය), හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී අංක 479, ටී. බී. ජයා මාවත කොළඹ 10.

දුරකථන අංක :011-2661821, 011-2661835.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරු සහ සාම විනිසුරු,
(මුළු දිවයිනටම)

කාර්යාලය : අංක 25 'බී' බෙල්මන්ට් වීදිය,
කොළඹ 12
දුරකථන අංක : 011-5756356, 011-2334808, 071-8760986
08-713

---

**ලංකා බැංකුව - රත්තොට ශාඛාව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධිත ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

රත්තොට, නිකොල්ඔය පාර, පොලිස් පටුමග, අංක 20 දරන ස්ථානයේ පදිංචි අබ්දුල් මජීඩ් මොහොමඩ් හාසිම් මයා හා මොහොමඩ් හාසිම් මොහමඩ් ජිෆ්රි මයා යන අයවළුන් විසින් උකස් කරන ලද දේපොළ.

අයිරා යොමු අංක : 130/99 ලංකා බැංකු ආඥාපනතේ 19 වෙනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2010.04.09 දිනැති අංක 1649 දරන *ගැසට් පත්‍රයේ* සහ 2010.03.26 දිනැති "දිනමිණ", "තිනකරන්", හා "ඩේලි නිවුස්" යන පුවත්පත්වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව මුල් මුදල් ශේෂය ද විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය, ගාස්තු හා එකී ආඥාපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා පරිශ්‍රය පිහිටි ස්ථානයේ දී 2010.09.30 වෙනි දින පෙරවරු 11.00 ට මහනුවර, ටොරින්ටන් පාර, අංක 24 හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ නැගෙනහිර, පල්ලේසිය පත්තුවේ, රත්තොට හි පිහිටි, බලයලත් මිනින්දෝරු ඒ. ජී. ඩබ්. ගිරාගම මයා විසින් සාදන ලද 1988.05.05 දිනැති අංක 1387 දරන පිඹුරේ කැබලි 1 යනුවෙන් පෙන්නුම් කර ඇති, "ස්ප්‍රිං හිල් වත්ත" (කොටස්) යයි හඳුන්වනු ලබන, උතුරට : මාතලේ සිට ගම්මඩුවට යන මහ පාර ද, නැගෙනහිරට : එම ඉඩමේම ඉතිරි කොටස ද, දකුණට : ස්ප්‍රිංහිල් වත්ත වෙන් කරන ජීව වැට ද, බස්නාහිරට : ජේ. මැල්කම්සන්ට අයත් ඉඩම වෙන් කරන ජීව වැට ද මායිම් වූ පර්චස් හතක (අක්. 0, රූ. 0, පර්. 7) ප්‍රමාණයෙන් යුත් බෙදා වෙන් කරන ලද ඉඩම් කට්ටිය සියල්ල, එහි තුළ ඇති වගාවන් හා සෑම සියළු දේත් වේ.

ඉහත කී ඉඩම පහත සඳහන් කර ඇති ඉඩමේ කොටසෙකි.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ නැගෙනහිර කෝරළේ, පල්ලේසිය පත්තුවේ රත්තොට හි පිහිටි, බලයලත් මිනින්දෝරු කේ. කුමාරසාමි හා ඒ. දොලොස්වල මහතුන් විසින් සාදන ලද, පිළිවෙලින් 1951.10.20 හා 1968.05.30 දිනයන්හි අංක 381 දරන පිඹුරේ කැබලි 'ඒ' යනුවෙන් පෙන්නුම් කර ඇති, මහ පාර පැත්ත දෙසට පිහිටා ඇති (කොටස්) "ස්ප්‍රිං හිල් වත්ත" යයි හඳුන්වනු ලබන, ඊශාන දෙසට : අංක 381 දරන පිඹුරේ පෙන්නුම් කර ඇති, එම ඉඩමේම අංක 'බී' දරන කැබල්ල ද, ගිනිකොණ දෙසට : ස්ප්‍රිංහිල්වත්ත ද, නිරිත දෙසට : ජෝශප් මැල්කම්සන් ට අයත් ඉඩම ද, වයඹ දෙසට : මාතලේ සිට ගම්මදුවට යන පී. ඩබ්ලිව්. ඩී. පාර ද මායිම් වූ පර්චස් දහ හතයි දශම අටක (අක්. 0, රූ. 0, පර්. 17.8) වපසරියකින් යුත් ඉඩම් කට්ටිය සියල්ල වේ. මෙය මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක සී 125/39 දරන පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ටී. ඩී. මෝහනසුන්දරම් මිය,
කළමනාකාරිණිය.

08-675

---

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - ත්‍රිකුණාමලය ශාඛාව**

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ත්‍රිකුණාමලය සුළු නගර සභා සීමාවන් තුළ පෙරියකාඩෙයි කොට්ඨාශ අංක 2 ජෝර්ජ් වීදියේ පිහිටි ඉඩමට බලයලත් මානක පී. මහේන්ද්‍රනාතන් විසින් 2004/01/10 වන දින අංක 03 දරණ පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් ඒ නමැති ඉඩම් කොටස හා එහි තුළ පිහිටි දෙමහල් නිවාස ගොඩනැගිල්ල ඇතුළු සියළු දේ. ඉඩමේ ප්‍රමාණය : පර්චස් 19.43.

*දේපලට පිවිසීම.-* ත්‍රිකුණාමලය ප්‍රසිද්ධ බස් නැවතුම් පොල අසල සිට වරාය තටාක (Dock yard) පාරේ ජෝර්ජ් වීදිය හන්දිය දක්වා ගමන් ගෙන ජෝර්ජ් වීදිය ඔස්සේ මීටර් 50 ක් පමණ ගිය පසු මෙම පාරේ දකුණු පසින් අදාල දේපල පිහිටා තිබේ.

මෙම දේපල, සරවනබාවා නොහොත් ශ්‍රී සරවනබාවා ආනන්දජෝති සහ ජයරාණි ආනන්ද ජෝති යන අය බන්ධනාදායි වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

2010 ක් වූ සැප්තැම්බර් මස 30 වන දින පෙ: ව. 11.00 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2010.06.18 දින *රජයේ ගැසට් පත්‍රය* ද 2010.06.16 දින ද අයිලන්ඩ්, දිවයින හා තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය :-* මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය.

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න :- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අයකිරීම් අංශය) හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2661815, 011-2661816

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමළුව පාර,
වටපුළුව, මහනුවර.
දුරකථන අංක : 081-2211025 / 071-4755974 ෆැක්ස් : 081-2211025.
08-663

---

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - ත්‍රිකුණාමලය ශාඛාව**

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ත්‍රිකුණාමලය සුළු නගර සභා සීමාවන් තුළ ත්‍රිකුණාමලය නගරයේ බසාර් කොට්ඨාශ අංක 8 පාසැල් පටුමග (පෙර කොත්ති ලේන්) හි පිහිටි කංගසිංහම් තාරායි නමැති ඉඩමට බලයලත් මානක ඒ. ලෝගනාතන් විසින් 2007/09/06 වන දින අංක 631 A දරණ පිඹුරේ නිරූපිත බෙදා වෙන් කළ ලොට් අංක ඒ නමැති ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සියළු දේ. ඉඩම් ප්‍රමාණය : පර්චස් 12.17.

*දේපලට පිවිසීම.-* ත්‍රිකුණාමලය ප්‍රසිද්ධ බස් නැවතුම් පොල අසල සිට සෙන්ට්‍රල් පාරේ ස්කූල් ලේන් දක්වා ගමන් කොට කොත්ති ලේන් එකට පිවිස මීටර් 30 ක් පමණ මෙම පාරේ ගමන් ගෙන දකුණට හැරී අදාල දේපලට පිවිසෙන පටුමග ඔස්සේ ගමන් ගත් විට අදාල දේපල පිහිටා තිබේ.

මෙම දේපල, මොහොමඩ් ෂා හනිෆා මොහොමඩ් ජවුෆර් හසන් යන අය බන්ධනදායි වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

2010 ක් වූ සැප්තැම්බර් මස 30 වැනි දින පෙ: ව. 10.00 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2010.06.18 දින *රජයේ ගැසට් පත්‍රය* ද 2010.06.16 දින ද අයිලන්ඩ්, දිවයින හා තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය :-* මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය.

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න :- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අයකිරීම් අංශය), හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2661815, 011-2661816.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමළුව පාර,
වටපුළුව,
මහනුවර.
දුරකථන අංක : 081-2211025 / 071-4755974 ෆැක්ස් : 081-2211025.
08- 662

---

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - මොරටුමුල්ල ශාඛාව**

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව යනුවෙන් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. බී. පෙරේරා විසින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියා සහතික කරන ලද 2006.08.04 දිනැති සහ අංක 2294 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම දොඩම් පහලගේ අනෝජන් ප්‍රියලාල් ප්‍රනාන්දු යන අය බන්ධනදායී ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී ණය මුදල් සහ ඒ මත අයවිය යුතු නෛතික පොලිය සහ වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළු සියළු මුදල් ප්‍රමාණයන් ද (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල අඩුකොට) අයකර ගැනීම සඳහා.

ඉහත කී හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ආයතනය මා වෙත පවරා ඇති බලතල අනුව පහත විස්තර කර ඇති දේපළ වර්ෂ 2010ක් වූ සැප්තැම්බර් මස 24 වැනි දින ප. ව. 1.30ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ මොරටුව නගර සභා සීමාවේ කටුබැද්දේ පොල්කොටුව පාරේ වරිපනම් අංක 79හි කදුරුගහකුඹුර නැමති ඉඩමට බලයලත් මානක එච්. ඩබ්ලිව්. ඒ. ද සිල්වා විසින් මැන සාදන ලද 2003.06.14 වන දින අංක 1932 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද කැබලි අංක 2 දරන ඉඩම.

පිඹුරු අංක 1932 හි ලොට් 4 ලෙස නිරූපිත (අඩි 10ක් පළල පාර) පර්චස් තුනයි දශම බින්දුවයි හතර (අ. 0, රූ. 0, පර්. 3.04) ක මාර්ග අයිතිය ද සමග වේ.

ප්‍රමාණය : පර්චස් එකොලහයි දශම නමයයි හතර (අ. 0, රූ. 0, පර්. 11.94)

*පිවිසීම* : කොළඹ - ගාල්ල ප්‍රධාන මාර්ගයේ රාවතාවත්ත දක්වා ගමන් කොට ආරක්ෂක මුරපොල පසුකොට කටුබැද්ද හන්දියෙන් රාවතාවත්ත පාරට පිවිස (සෙලාන් බැංකුව ඉදිරිපිට) යාර කිහිපයක් ගමන් කිරීමේදී හමුවන පොල්කොටුව පාරේ (පන්සලට යාමට ඇති පාරේ) යාර කිහිපයක් ඉදිරියට ගමන් කිරීමේදී වම් පැත්තට වන්නට මෙම දේපල පිහිටා ඇත.

මේ පිළිබඳ යෝජනා සම්මුතිය 2010.07.09 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද 2010.07.08 වැනි දින අයිලන්ඩ් දිවයින තිනකරන් පත්‍රවල පළවී ඇත.

*ගෙවීමේ ක්‍රමය.*—වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැනුම්කරු විසින් පහත ගෙවීම් මුදලින් කළයුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. ප්‍රාදේශීය සභා බදු සඳහා 1% (සියයට එකයි),
3. සියළුම ප්‍රචාරක වියදම්,
4. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් ගැනුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
5. විකුණුම් කොන්දේසි පිළියෙල කිරීමේ හා නොතාරිස් ගාස්තු,
6. ලිපිකරු හා සෝෂක ගාස්තු,

ගැනුම් මිලෙන් 90%ක් (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30ක් ඇතුලත දී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී ආයතනයට ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වන විට ගෙවා ඇති මුදල් ආපසු නොගෙවන අතර එම දේපල නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු තිරප්පු පරීක්ෂාව සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණයඅයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී අංක 479 ටී. බී. ජයා මාවත, කොළඹ 10 - දුරකථන අංක 2661826 - 2661835 න් ලබා ගත හැක.

හේමචන්ද්‍ර දළුවත්ත,
උසාවි කොමසාරිස් බලයලත් වෙන්දේසිකරු
සහ තක්සේරුකරු.

අංක 99, උසාවිය පාර,
කොළඹ 12,
දුරකථන අංක : 071-4175944, 075-8489378.
08-719

---

**ඩී. එෆ්.සී.සී. බැංකුව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ වටිනා නිශ්චල දේපල/යන්ත්‍ර සූත්‍ර හා උපකරණ වෙන්දේසියේ විකිණීම

**අංක 24250 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපල පිළිබඳ විස්තර**

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අලුත්කූරු කෝරළේ දාසිය පත්තුවේ කටුනායක සීදූව නගර සභා සීමාව ඇතුළත ලියනගෙමුල්ලේ පිහිටි දවටගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඊ. ජේ. බී. පෙරේරා විසින් මැන සාදන ලද අංක 3120 හා 1993.07.28 වැනි දින දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 01 නමැති බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස හා එහි තුළ පිහිටි වරිපනම් අංක 21, පල්ලිය පාර, ලියනගේමුල්ල. ඉඩමේ ප්‍රමාණය : අ.0 - රූ.0 - පර්. 39.68 හෝ හෙක්ටයාර් 0.10036 එහි ගස කොළ වැවිලි හා අනෙකුත් දේ.

අංක 24251 දරන උකස්කරය යටතේ උකස් කරන ලද චංචල පිරියත, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ විස්තර

| | *විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|---|
| 1. | 450 Lbs මැෂින් | 02 |
| 2. | 200 Lbs ඩ්‍රයර් | 03 |
| 3. | හයිඩ්‍රො මැෂින් | 02 |
| 4. | සාම්පල් මැෂින් | 01 |
| 5. | 100 Lbs ටම්බල් ඩ්‍රයර් | 05 |
| 6. | 450 Lbs ඉන්ඩස්ට්‍රියල් වොෂර් | 02 |
| 7. | අඟල් 36 හයිඩ්‍රො එක්ස්කැවේටර් | 01 |
| 8. | ක්ලිවර් බෲක්ස් ස්ටීම් බොයිලර් | 01 |
| 9. | කන්ඩෙන්සර් ටැන්ක් | 01 |
| 10. | ෆර්නස් ඔයිල් ටැන්ක් | 01 |
| 11. | චිමිනි | 01 |
| 12. | වෝටර් සිෂ්ටිං යුනිට් | 01 |

ඇතුළුව සීදූව, මූකලන්ගමුව, මුණිදාස කුමාරතුංග මාවත අංක 364ඒ දරණ පරිශ්‍රය තුළ සහ මත දැනට තිබෙන අමතර කොටස් උපාංග සහ මෙවලම් හෝ වෙනත් ඕනෑම ගුදමක තිබිය හැකි මෙවලම් උපකරණ සහ පිරියත.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. ඒ. එන්. ඩබ්ලිව්. රාජකරුණා විසින් සහතික කරන ලද 2006.09.21 වැනි දින අංක 24250 සහ 24251 දරන උකස්කරයන් ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ නීතිගත වූ සහ එහි ලියාපදිංචි කාර්යාලය සීදූවේ පිහිටා ඇත්තා වූ සමාගමක් වන බ්‍රිලියන්ට් වොෂිං (ප්‍රයිවෙට්) ලිමිටඩ් සහ දෙදෙනාම සීදූවේ පදිංචි කිත්තම්පහු කෝරලලාගේ හද්‍රා රම්‍යශීලි සහ කිරිවත්තුඩුවගේ දොන් සුනිල් අමරතුංග යන අය විසින් ඉහත කී නිශ්චල දේපල යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ඩී.එෆ්.සී.සී. බැංකුවට උකස් කරන ලදුව ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාරව ඉෂ්ඨ නොකරන ලද දේපළ,

ඩී.එෆ්.සී.සී. බැංකුව විසින් මා වෙත පවරන ලද බලය ප්‍රකාරව

*නිශ්චල දේපල* : 2010 ක් වූ සැප්තැම්බර් මස 24 වැනි දින පෙ. ව. 11.00 ට

*චංචල දේපල* : 2010 ක් වූ සැප්තැම්බර් මස 24 වැනි දින පෙ. :ව. 11.30 ට එම දේපල පිහිටි ස්ථානයන් හි දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය* :- මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුලු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.

ගැනුම් මිලෙන් 90% (සියයට අනූවක්) ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී.එෆ්.සී.සී. බැංකුවේ නීති දෙපාර්ත්මේන්තුව අමතන්න.

දුරකථන අංක : 011-2440366 / 011-2442442.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමළුව පාර,
වටපුළුව,
මහනුවර.
දුරකථන අංක : 081-2211025 / 071-4755974 ෆැක්ස් : 081-2211025
08- 664

---

**මහජන බැංකුව - ධර්මපාල මාවත ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29-ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත 2010.09.15 වැනි දින පෙ.ව. 10.30ට මෙහි පහත විස්තරවන දේපළ එකී දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය**

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ කන්ඳබඩ පත්තුවේ නරවැල්පිට පිහිටි තුසෙව්මිනිහාගෙ වත්ත නමැති ඉඩම 2005.07.16 දිනැති එම්.එල්.එම්.රශ්මි බලයලත් මිනින්දෝරු මහතාගේ අංක 2358 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කල "ඒ" අක්ෂරය දරන රූඩ් එකයි පර්චස් අටක් (අක් 0 රූඩ් 01 පර් 08) විශාල ඉඩම හා එහි පිහිටි වැවිලි ගොඩනැගිලි ආදී සියලු දෙය ද වේ.

වැඩි විස්තර සඳහා 2008.02.29 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද 2008.03.14 වැනි දින "දිනමිණ" පුවත්පතේ ද පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපොළට පිවිසීමේ මාර්ගය* .- හක්මණ, ඇලවේල්ල මාර්ගයේ කි.මී.1, 1/2 ක් පමණ යන විට නරවැල්පිට හන්දිය හමු වීමට පෙර පාරේ දකුණු පස මෙම දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය :-

1. ගැණුම් මිළෙන් 10%ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට විකුණුම් මිළෙන් 1% ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිළෙන් 2,1/2% ක් ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු.500 ක් ද,
5. විකුණුම් වියදම සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල ද,
6. විකුණුම් සහතිකය හා මුද්දර ගාස්තු ද වේ.

ගැණුම් මිළෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුලත මාතර, නූපේ, අනගාරික ධර්මපාල මාවතේ අංක 215 දරන ස්ථානයේ පිහිටි මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ, ප්‍රාදේශීය කළමනාකාර මහතාට ගෙවිය යුතු ය.

දුරකථන අංක : 041-2222792 , 2222822 හා 2224773

ෆැක්ස් අංකය : 041-2222688

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත කී ලිපිනයෙන් ලබා ගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30 ක් ඇතුලත නොගෙවූවහොත් දැනටමත් ගැණුම් මිළෙන් ගෙවා ඇති 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ජී. පී. ආනන්ද (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත,
වල්ගම, මාතර.
දුරකථන අංක : 041-2228731 , 071-4438516.
08-628

---

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ දැන්වීම

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරලේ පල්ලෙපත්තුවේ හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ, හෝමාගම, ගලවිලවත්ත, සුනේත්‍රා මාවතේ, අංක 9 හි පිහිටි ගලවිල එස්ටේට් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු වී.ඒ.එල්. සේනාරත්න විසින් සාදනලද 1964 ජනවාරි 07 දිනැති අංක 2858 දරන පිඹුරෙහි නිරූපිත ප්‍රකාර පර්චස් විස්සක ( පර්ඃ20 ) වඩා නිවැරදිව පර්චස් දහනවයයි දශම හයක (පර්. 19.6) බිම් ප්‍රමාණයකින් යුක්තවූ ලොට් 46 - උකස් කළ දේපල

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2010 ජූනි මස 04 දිනැති අංක 1657 දරන *ගැසට් පත්‍රයේ* හා 2010 මැයි 26 දිනැති දිනමිණ, ඩේලිනිවුස් හා තිනකරන් යන පුවත්පත්වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගතහැකි මුල් මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර පිහිටි ස්ථානයේ දී ම 2010 සැප්තැම්බර් මස 24 වැනි දින පෙ. ව. 11.00 ට කොළොන්නාව, විහාර මාවත, අංක 50/3 හි පදිංචි T & H ඔක්ෂන්ස් වෙන්දේසිකාර මහතුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

**ඉහත සඳහන් උපලේඛනය**

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරලේ පල්ලෙපත්තුවේ හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ, හෝමාගම, ගලවිලවත්ත, සුනේත්‍රා මාවතේ, වරිපනම් අංක 9 දරන ගොඩනැගිල්ල, ගහකොළ, වැවිලි සහ එහි ඇති වෙනත් සියල්ල ඇතුළත් වූ ගලවිල එස්ටේට් නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු වී.ඒ.එල්. සේනාරත්න විසින් සාදනලද 1964 ජනවාරි 07 දිනැති අංක 2858 දරන පිඹුරෙහි නිරූපිත ලොට් 46 උකස් දේපල එනම්, එකී ලොට් 46 උතුරට ලොට් 53 ද, නැගෙනහිරට ලොට් B (පාරට වෙන්කළ කොටස සඳහා) ද, දකුණට ලොට් 41 ද, බස්නාහිරට ලොට් 45 ද, මායිම්ව එකී අංක 2858 දරන පිඹුර ප්‍රකාර පර්චස් විස්සක (අඃ0 රූඃ0 පර්ඃ20) වඩා නිවැරදිව පර්චස් දහනවයයි දශම හයක (අ. 0 රූ. 0 පර්. 19.6) බිම් ප්‍රමාණයකින් යුක්තවන අතර, මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී785/271 හි ලියාපදිංචි කර ඇත.

මහජන නොතාරිස් බන්දුමතී බෝධිනායක රණසිංහ විසින් සහතික කරනලද 1994.12.27 දිනැති අංක 2561 දරන උකස් බැඳුම්කරය

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

එච්. එම්. ටී. තිලකරත්නබණ්ඩා
සම්බන්ධතා කළමනාකරු
(අයකරගැනීම් - ආයතනික).

ලංකා බැංකුව,
අයකරගැනීමේ ඒකකය,
අංක 4, ලංකා බැංකු මාවත,
කොළඹ - 01
08-673

---

**සම්පත් බැංකුව පීඑල්සී**

(කලින් සීමාසහිත සම්පත් බැංකුව නමින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ විකුණුම් නිවේදනය

ඩී. සුමතිපාල - ගිණුම් අංක 0001 5018 3669

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.02.23 වැනි දින යෝජනා කොට සම්මත කරගනු ලැබ 2010.08.13 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද 2007.12.04 වැනි දින දිවයින,අයිලන්ඩ් සහ 2007.12.03 දින තිනකුරල් යන දිනපතා පුවත්පත් වල ද පළකරන ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දාහතර ලක්ෂ අසූ දෙදහස් පනහකුත් ශත අනූවක (රු. 14,82,050.90 ක් පමණයි) මුදල සමග තවත් රුපියල් දහතුන් ලක්ෂ අනූ දෙදහසක (රු. 13,92,000 ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට දොළහයි දශම පහ (12.5%) බැගින් 2005 දෙසැම්බර් 14 වැනි දින සිට වෙන්දේසි දින තෙක් තව දුරටත් පොලී මුදල ද සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවා ද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි.ඩබ්ලිව්. ජයසූරිය විසින් 2010.09.15 වැනි දින ප.ව. 2.00 ට දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ අළුත්කූරු කෝරලේ අඹතලෙන් පහළ කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාව තුළ වෙන්නවත්තේ පිහිටි සදහම් මාවත වරිපනම් අංක 23 දරන "වරක දෙල්ගහවත්ත සහ වරකදෙල්වත්ත" නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් සාදන ලද 1998 මැයි 06 දාතම හා අංක 4741 දරන පිඹුරේ ලොට් A වශයෙන් ලකුණු කොට නිරූපිත උතුරටඃ සදහම් මාවතද, නැගෙනහිරටඃ බලයලත් මිනින්දෝරු එස්. එච්. පීරිස් විසින් සාදන ලද අංක 2510 පිඹුරේ ලොට් 21 A ද දකුණට : බලයලත් මිනින්දෝරු එස්.එච්. පීරිස් විසින් සාදන ලද අංක 2510 පිඹුරේ ලොට් 21 A ද සහ බටහිරට : පී. විතානගේ ගේ ඉඩම ද මායිම්වන ප්‍රමාණයෙන් පර්චස් දහයක් (අක් 0 රූඩ් 0 පර්. 10) වන බෙදා වෙන්කොට සීමා නිර්ණය කල බිම් කොටස එහි පස, ගහකොල, වගාවන්, ගොඩනැගිලි සහ අනෙකුත් සියලු දේ සමගය.

එකී ලොට් A බිම් කොටස පහත විස්තර කෙරෙන ඉඩමේ ප්‍රතිමිනුමකි.

ඉහත කී වෙන්නවත්තේ පිහිටි වරකදෙල්ගහවත්ත සහ වරකදෙල්වත්ත නමැති ඉඩමෙන් බලය ලත් මිනින්දෝරු එච්.එම්. ප්‍රනාන්දු විසින් සාදන ලද 1967 ජූලි 06 දාතම හා අංක 4071 දරන පිඹුරේ ලොට් 22 වශයෙන් ලකුණු කොට නිරූපිත කොළඹ ඉඩම් කාර්යාලයේ B 817/291 හි ලියා පදිංචි කොට ඇති උතුරට : පාර සහ කණ්ඩියද නැගෙනහිරට : ලොට් 21 ද දකුණට : ලොට් 21 ද සහ බටහිරට : එම ඉඩමේ කොටසක් වන එන්. ජේ. කුරේගේ ඉඩමද, මායිම්වන ප්‍රමාණයෙන් පර්චස් දහයක් (අක් 0 රූඩ් 0 පර්චස් 10) වන බෙදා වෙන්කොට සීමා නිර්නය කළ බිම් කොටස එහි පස, ගහකොල, වගාවන්, ගොඩනැගිලි හා අනෙකුත් සියලුම දේ සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

08-717/6

---

**සෙලාන් බැංකුව පීඑල්සී - හලාවත ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ වෙන්දේසියේ විකිණීම

මෙම දේපල හලාවත ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ අංක 27/0889 දරන මෙසස් නිමේෂ් එන්ටර්ප්‍රයිසස් යන නාමය විලාසය සහ අභිධානය යටතේ ස්වාමීත්වයේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන වර්ණකුලසූරිය ජෝෂප් ප්‍රනාන්දු යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ හලාවත ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුල පිටිගල් කෝරළේ උතුර අනෙයි විලුන්දන් පත්තුවේ හලාවත නගරයේ නගර සභා සීමාව තුළ වෝඩ් අංක 1 වට්ටක්කාලිය ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. ඒ. විමලසේන විසින් සාදන ලද 1994 අප්‍රේල් මස 04 දිනැති අංක 594 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන, කැනැල් රෝඩ් වරිපනම් අංක 73ඒ/4 දරන වට්ටක්කාලියකානි නමැති ඉඩමේ ප්‍රමාණයෙන් අක්කර එකයි, රූඩ් තුනයි, පර්චස් දහහතක් (අ. 1, රූ, 3, පර්. 17) විශාල එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව ඩී 165/144 හි ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් ඉඩම ඉහත සඳහන් ඉඩමේ නැවත මැනීමක් වේ.

වයඹ පළාතේ පුත්තලම් දිස්ත්‍රික්කයේ හලාවත ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ පිටිගල් කෝරළේ උතුර අනෙයිවිලුන්දන් පත්තුවේ හලාවත නගරයේ නගර සභා සීමාව තුළ වටට්ක්කාලිය ගමේ වෝඩ් අංක 1 කැනැල් රෝඩ් පිහිටි බලයලත් මිනින්දෝරු එස්. ශ්‍රීදරන් විසින් සාදන ලද 2005 නොවැම්බර් 05 දිනැති අංක 2661 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන වට්ටක්කාලියකානි නමැති ඉඩමේ ලොට් 1 දරන බෙදූ ඉඩම් කොටස ප්‍රමාණයෙන් අක්කර එකයි, රූඩ් තුනයි, පර්චස් දහහතක් (අ. 1, රූ. 3, පර්. 17) විශාල එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

මාර්ග අයිතිය.-වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ හලාවත ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ පිටිගල් කෝරළේ උතුර අනෙයිවිලුන්දන් පත්තුවේ හලාවත නගරයේ නගර සභා සීමාව තුළ වට්ටක්කාලිය ගමේ, වෝඩ් අංක 1 කැනැල් රෝඩ් පිහිටි බලයලත් මිනින්දෝරු එස්. ශ්‍රීදරන් විසින් සාදන ලද 2005 නොවැම්බර් මස 05 දිනැති අංක 2661 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන වට්ටක්කාලියකානි නමැති ඉඩමේ ලොට් 2 (අඩි 12 ක් පළල පාර) දරන බෙදූ ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් විසිඅටයි දශම හතරක් (අ. 0, රූ. 0, පර්. 28.4) විශාල අඩි 12 ක් පළල පාර සමග ඉඩම. මෙය හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව ඩී 165/139 හි ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් දේපල 2010 සැප්තැම්බර් මස 16 වැනි දින පෙරවරු 11.30 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසීම.*- හලාවත බසාර් වීදියේ සිට අලුත්වත්ත පාරේ කි. මී. 2.3 ක් ගොස් දුම්රිය හරස් පාර ද පසුකර ඉදිරියට ඇති කැනැල් පාරේ වමට හැරී අඩි 12ක් පළල ඉඩමට යෑමට ඇති පාරේ මීටර් 260 ක් පමණ ගිය විට අදාළ දේපලට පිවිසිය හැක. මෙම පාරේ මීටර් 100 ක් පමණ දුරට දෙපස කම්බි ගසා ඇත.

යෝජනා සම්මුති දැන්වීම.- *රජයේ ගැසට් පත්‍රයේ* 2010.05.21 වැනි දින පළ වී ඇති අතර ඩේලිමිරර් සහ ලංකාදීප පුවත්පත්වල 2010.05.08 වැනි දින ද තිනකුරල් පුවත්පතේ 2010.05.26 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදල් ගෙවීම් කළ යුතුය :-

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්), වන පළාත් අධිකාරි බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන ඕනෑම බද්දක්, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක් 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිම කළ යුතුය. හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : සහකාර සාමාන්‍යාධිකාරි (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03, දුරකථන අංක : 011-2456285, 2456276, 2456284.

තුසිත කරුණාරත්න, (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව,
දුරකථන අංක : 011-3068185, 011-2572940.
08-687

---

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

එන්. එස්. ද එස්. විජේරත්න,
ගිණුම් අංක : 1001 0001 1810

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2007.04.26 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් නම ලක්ෂ තිස් හය දහස් හතලින් තුනයි ශත පහළවක (රු. 9,36,043.15) මුදල ද, 2007 ජනවාරි 26 වැනි දින සිට අයවිය යුතු මුලු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හය ලක්ෂ හැට නම දහස් දහ අටයි ශත පහළවක (රු. 6,69,018.15) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහක් (5%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2010.05.14 දින *රජයේ ගැසට් පත්‍රයේ*, 2010.03.19 දින "දිවයින", "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි 2010.09.16 දින ප. ව. 3.30 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ මැද පත්තුවේ හෝමාගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ ඕවිටිගම පිහිටි මිල්ලගහකනත්ත සහ අලිකෙදෙණියලන්ද, යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. ඒ. සුගතපාල යන අය විසින් සාදන ලද 1997 ජනවාරි මස 17 දාතම හා අංක 1203 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණය කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : බලයලත් මානක තැන ඩී. පී. ඒ. ජයසිංහ යන අය විසින් සාදන ලද අංක 238 ඒ දරන පිඹුරේ ලොට් 11 නැගෙනහිරට : බලයලත් මානක තැන එච්. ඩී. පී. ගුණවර්ධන යන අය විසින් සාදන ලද 1993 නොවැම්බර් මස 05 සහ 1994 ජනවාරි මස 27 දාතම හා අංක 272 දරන පිඹුරේ ලොට් 27, දකුණට : අංක

272 දරන පිඹුරේ ලොට් 28 සහ බස්නාහිරට : අංක 272 දරන පිඹුරේ ලොට් 17 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විස්සක් (අ. 0 රූ. 0 පර්. 20) ඉඩම් කොටස සමග පස, ගහකොළ වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 1203 දරන පිඹුරට අනුව වෙලුම/පත්ඉරුව N 147/262 යටතේ අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
සමාගම් ලේකම්.

08-717/2

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)
1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

කේ. එම්. කේ. එස්. ජේ. ප්‍රනාන්දු,
ගිණුම් අංක : 1030 5336 7893

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2009.11.26 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දහ හතර ලක්ෂ තිස් නම දහස් හත්සිය හැට තුනයි ශත විසි නමයක (රු. 14,39,763.29) මුදල ද, 2009 සැප්තැම්බර් මස 12 වැනි දින සිට අංක 116 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුලු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දොලොස් ලක්ෂ හතලිස් නම දහස් නමසිය අනූ දෙකක (රු. 12,49,992) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි තුනක් (23%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2010.01.28 දින *රජයේ ගැසට් පත්‍රයේ*, 2010.01.18 දින දිවයින, සහ තිනකුරල් සහ අයිලන්ඩ් දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි 2010.09.24 දින ප. ව. 3.30 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ මාරවිල ලියාපදිංචි කොට්ඨාසයේ දකුණු පිටිගල් කෝරළේ කම්මල් පත්තුවේ නැගෙනහිර දුම්මලදෙනියේ පිහිටි "කහටගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. එස්. එස්. ඒ. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 2002 පෙබරවාරි මස 18 දාතම හා අංක 341 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 4 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : ලොට් 3 සහ 2 නැගෙනහිරට : ආර්. ජේ. මිල්රට් ප්‍රනාන්දු යන අයගේ ඉඩම, දකුණට : ලොට් 16 සහ 13 සහ බස්නාහිරට : ලොට් 13 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහළවක් (අක්. 0 රූ. 0 පර්. 15) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 341 දරන පිඹුරට අනුව වෙලුම/පත්ඉරුව ජී 109/229 යටතේ මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අංක 341 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 සහ 13 දිගේ, හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
සමාගම් ලේකම්.

08-717/3

---

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කළින් හැඳින්වූ)**
1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

ජී. එල්. අයි. ආර්. මෙන්ඩිස් සහ එච්. පී. එච්. එස්. එන්. අප්පුහාමි
ගිණුම් අංක 1030 5337 8860

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2009.01.29 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හත් ලක්ෂ අනූ අට දහස් නමසිය පනස් හතරයි ශත හැත්තෑ එකක (රු. 798,954.71) මුදල ද 2008 දෙසැම්බර් මස 05 දින සිට අංක 1801 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුලු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හත් ලක්ෂ විසි එක් දහස් අටයි ශත විස්සක (රු. 721,008.20) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි තුනක් (23%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2009.11.27 දින *රජයේ ගැසට් පත්‍රයේ*, 2009.11.20 දින දිවයින, තිනකුරල් සහ අයිලන්ඩ් දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි 2010.09.23 දින පෙ. ව. 11.30ට පිහිටි ස්ථානයේදී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

**උපලේඛනය**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වල්ගම්පත්තු කෝරලේ දේවමැදි හත්පත්තුවේ වාරියපොල ප්‍රාදේශීය සභා සීමාවන් තුල පුබ්බෝව පිහිටි කොලොන්ගහමුලහේන දැන් වත්ත යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ආරියදාස අතපත්තු යන අය විසින් සාදන ලද 2005 ජනවාරි මස 30 දාතම හා අංක 2005/16 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 01 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට අංක 88/95 දරන පිඹුරේ ලොට් 01හී ඉතිරි කොටස, නැගෙනහිරට අංක 88/95 දරන පිඹුරේ ලොට් 1 හි ඉතිරි කොටස, දකුණට: අංක 88/95 දරන පිඹුරේ ලොට් 2 සහ බස්නාහිරට : කඩහපොල සිට රඹවැව දක්වා ප්‍රධාන පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් පහක් (අක්. 0 රූ. 0 පර්. 35) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 2005/16 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව ඩී 1138/272 යටතේ කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
සමාගම් ලේකම්.

08-717/5

---

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කළින් හැඳින්වූ)**
1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

ඩබ්ලිව්. එම්. එල්. බී. ප්‍රනාන්දු සහ ආර්. ආර්. ඒ. පී. ආර්. ස්ටෙලා
ගිණුම් අංක : 1030 5315 2051

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2010 මාර්තු මස 25 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හත් ලක්ෂ අනූ අට දහස් එකසිය පනස් නමයයි ශත විස්සක (රු. 7,98,159.20) මුදල ද 2010 ජනවාරි මස 07 දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හත් ලක්ෂ විසි පන් දහස් අටසිය පනහයි ශත අසූ නමයක (රු. 7,25,850.89) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරක් (14%) බැගින් වූ පොලිය ද හා ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2010.05.07 දින *රජයේ ගැසට් පත්‍රයේ*, 2010.04.26 දින දිවයින, අයිලන්ඩ් සහ තිනකුරල් දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2010.09.23 දින ප. ව. 2.00ට පිහිටි ස්ථානයේදී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ, දකුණු මාරවිල ලියාපදිංචි කොට්ඨාසයේ පිටිගල් කෝරළේ මැද පළාත දුංකන්නව, තබ්බෝව සහ සන්දනම්ගම ග්‍රාමයේ පිහිටි සිට්ටවන තොට්ටම් යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ආර්. බී. නවරත්න යන අය විසින් සාදන ලද 1997 අප්‍රේල් මස 05 දාතම හා අංක 3530 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 152 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 125 සහ 153, නැගෙනහිරට : තම්පොරේ එස්ටේට් දකුණට : බලයලත් මානක තැන රංජිත් යාපා යන අය විසින් සාදන ලද අංක 4862 දරන පිඹුරේ ලොට් 2 සහ බස්නාහිරට : ලොට් 151 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසිහතරක් (අක්. 0 රූ. 0 පර්. 24) හෝ හෙක්ටයාර 0.0607ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොල වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග වෙළුම/පත්ඉරුව ජේ 71/284 යටතේ මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී අංක 3530 දරන පිඹුරේ නිරූපිත ලොට් 125, 94, 53, 43 සහ 13 දිගේ හා මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
සමාගම් ලේකම්.

08-717/4

---

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කළින් හැඳින්වූ)**
1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ස්කයි ඊ - නෙට් කොම්පියුටර් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ගිණුම් අංක : 0030 1000 1136

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2004.12.16 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දහ හත් ලක්ෂ පනස් එක් දහස් හාරසිය තිස් නමයයි ශත පනහක (රු. 1,751,439.50) මුදල ද 2004 ඔක්තෝබර් මස 01 වැනි දින සිට අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දහ තුන් ලක්ෂ අනූ හත් දහස් තුන්සිය දහහතරයි ශත හතලිස් හතරක (රු. 13,97,314.44) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි හයක් (26%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම්ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2010.07.09 දින *රජයේ ගැසට් පත්‍රයේ*, 2010.06.21 දින දිවයින, තිනකුරල් සහ අයිලන්ඩ් දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2010.09.24 දින ප. ව. 1.00ට පිහිටි ස්ථානයේදී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**ඉහත කී උපලේඛනය**

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ලියාපදිංචි කොට්ඨාසයේ සහ මහ නගර සභා සීමාවන් තුල කුරණ 2 වැනි කොට්ඨාසයේ, පිහිටි ගොයියාකුඹුර යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. එස්. එස්. පෙරේරා යන අය විසින් සාදන ලද 1993 ජූලි මස 09 දාතම හා අංක 1884/2 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 1සී වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එකී පිඹුරේ ලොට් 1ඒ, 1බී සහ 2, නැගෙනහිරට : මීගමුව මහ නගර සභාවට අයිති ඉඩම, දකුණට : ක්‍රිස්ටි පණ්ඩිතරත්න, ජෝශප් අප්පුහාමි සහ ඩෙරික් යන අයගේ ඉඩම් සහ බස්නාහිරට : එන්. නිහාල් ප්‍රනාන්දු යන අයගේ ඉඩම, අඩි 10 පළල පාර සහ එකී පිඹුරේ ලොට් 1ඒ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් හතරයි දශම දෙකයි තුනක් (අක්. 0 රූ. 0 පර්. 34.23) විශාල ඉඩම් කොටස සමග එහි පිහිටි සෑම සියලු දේ වෙළුම/පත්ඉරුව 225/234ඒ යටතේ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දෑ දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ මාර්ග අයිතියද සමග

එකී අංක 1884/2 දරන පිඹුරේ නිරූපිත එකී කුරණ 2 වැනි කොට්ඨාසයේ, පිහිටි ගොයියාකුඹුරේ හී ලොට් 1බී යන ඉඩම් කොටසට මායිම් උතුරට බලයලත් මානක තැන එච්. එල්. කෲස් දබ්‍රේරා යන අය විසින් සාදන ලද 1969 ජූලි 04 දාතම හා අංක 1502/1969 දරන පිඹුරේ ලොට් 1 නැගෙනහිරට අංක 1884/2 දරන එකී පිඹුරේ ලොට් 2 සහ 3 දකුණට ලොට් 1 සී සහ බස්නාහිරට ලොට් 1ඒ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හතරයි දශම පහයි දෙකක් (අක්. 0 රූ. 0 පර්. 4.52යි) වෙළුම/පත්ඉරුව ඒ 225/235 යටතේ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී අංක 1884/2 දරන පිඹුරේ නිරූපිත එකී කුරණ 2 වැනි කොට්ඨාසයේ, පිහිටි "ගොයියාකුඹුර" හී ලොට් 3 යන ඉඩම් කොටසට මායිම්, උතුරට : එකී අංක 1502/1969 දරන පිඹුරේ ලොට් 1 සහ අඩි 10 පළල පාර, නැගෙනහිරට : මීගමුව මහ නගර සභාවට අයිති ඉඩම, දකුණට: අංක 1884/2 දරන එකී පිඹුරේ ලොට් 2 සහ බස්නාහිරට : ලොට් 1බී යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් එකයි දශම පහයි පහක් ( අක්. 0 රූ. 0ප්. 1.55) වෙළුම/පත්ඉරුව ඒ225/265 යටතේ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී අංක 1502/1969 දරන පිඹුරේ නිරූපිත එකී කුරණ 2 වැනි කොට්ඨාසයේ, පිහිටි "ගොයියාකුඹුර" හී ලොට් 3 යන ඉඩම් කොටසට මායිම්, උතුරට : තලාදූව පාර, නැගෙනහිරට : මීගමුව මහ නගර සභාවට අයිති ඉඩම දකුණට : එකී අංක 1502/1969 දරන එකී පිඹුරේ ලොට් 2 සහ බස්නාහිරට : එකී අංක 1502/1969 දරන එකී පිඹුරේ ලොට් 01 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහයි දශම දෙකක් (අක්. 0 රූ. 0 පර්. 5.2) වෙළුම/පත්ඉරුව ඒ 225/198 යටතේ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
සමාගම් ලේකම්.

08-717/1

---

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - නුගේගොඩ ශාඛාව**
(කළින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව යනුවෙන් හඳුන්වනු ලැබූ)
1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යූ. එස්. කේ. හේරත් විසින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියා සහතික කරන ලද 2005.09.07 දින සහ 2006.08.22 දිනැති සහ පිළිවෙලින් අංක 2214 සහ 2491 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම හෙට්ටිගේ චමින්ද පෙරේරා යන අය බන්ධනදායී ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී ණය මුදල් සහ ඒ මත අයවිය යුතු නෛතික පොළිය සහ වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළු සියලු මුදල් ප්‍රමාණයන් ද, (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල අඩුකොට) අයකර ගැනීම සඳහා, ඉහත කී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී ආයතනය මා වෙත පවරා ඇති බලතල අනුව පහත විස්තර කර ඇති දේපළ වර්ෂ 2010 ක් වූ සැප්තැම්බර් මස 23 වැනි දින ප.ව. 1.30 ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාවේ ඇරැව්වල දියපොරගහදෙණිය නමැති ඉඩමට බලයලත් මානක එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් මැන සාදන ලද 1996.10.10 වැනි දින අංක 1864 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද කැබලි අංක 2 දරන ඉඩම ප්‍රමාණය : පර්චස් දහයයි දශම හතරයි බින්දුව (අ. 0, රූ. 0, පර්. 10.40)

*පිවිසීම*.- මහරගම නගරයේ සිට හයිලෙවල් පාරේ කොට්ටාව දෙසට කි. මී. 2 1/2 පමණ ගමන් කොට හතරමන්හන්දිය පසුකොට බෝගහ ළඟින් හයිලෙවල් පාරට සමාන්තරව වැටී ඇති කඩවල පාරේ මීටර් 600 පමණ ඉදිරියට ගමන් කිරීමේදී වමට හැරෙන වංගුවේ වම් පැත්තේ මෙම දේපල පිහිටා ඇත.

මේ පිළිබඳ යෝජනා සම්මුතිය 2010.07.09 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද 2010.07.09 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පත්‍රවල පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ :-

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. ප්‍රාදේශීය සභා බදු සඳහා 1% (සියයට එකයි),
3. සියලුම ප්‍රචාරක වියදම්,
4. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් ගැනුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
5. විකුණුම් කොන්දේසි පිළියෙල කිරීමේ හා නොතාරිස් ගාස්තු,
6. ලිපිකරු සහ සෝෂක ගාස්තු.

ගැනුම් මිලෙන් 90% ක් (සියයට අනූවක්), විකිණීමේ දින සිට දින 30 ක් ඇතුලත දී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී ආයතනයට ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වන විට ගෙවා ඇති මුදල් ආපසු නොගෙවන අතර එම දේපල නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු තිරප්පු පරීක්ෂාව සඳහා ජ්‍යෙෂ්ඨ - කළමණාකරු (ණය අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී අංක 479 ටී. බී. ජායා මාවත - කොළඹ 10 - දුරකථන අංක 2661826 - 2661835 න් ලබා ගත හැක.

හේමචන්ද්‍ර දළුවත්ත,
උසාවි කොමසාරිස් බලයලත් වෙන්දේසිකරු,
සහ තක්සේරුකරු.

නො. 99 උසාවිය පාර,
කොළඹ 12,
දුරකථන අංක : 071-4175944
075-8489378

08-720

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)
1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

සමන්ත ජයවික්‍රම ඇන්ඩ් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්
ගිණුම් අංක : 0010 1000 8383

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2008 අගෝස්තු මස 28 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් පන් කෝටි පනස් එක් ලක්ෂ හතලිස් හය දහස් නමසිය පනස් නමයයි ශත හැත්තෑ හතරක (රු.5,51,46,959.74) මුදල ද 2008 අප්‍රේල් 02 දින සිට අයවිය යුතු මුලු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හාර කෝටි දෙලක්ෂ පනස් පන් දහස් හැත්තෑ පහක (රු. 4,02,55,075) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විස්සක් (20%) හා තවත් රුපියල් එක් කෝටි විසි තුන් ලක්ෂ හතලිස් තුන් දහස් හත්සිය පනහක (රු. 1,23,43,750) මුදලක් සඳහා වාර්ෂිකව සියයට එකොලහක් (11%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තුද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2009.06.26 දින *රජයේ ගැසට් පත්‍රයේ* 2009.02.03 දින "දිවයින" "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළ කොට ඇති පරිදි 2010.09.20 දින ප.ව. 3.00 සිට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

1. දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ වැලිගම් කෝරළේ තල්අරඹ හි පිහිටි "ඉදිගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. ආර්. කුලරත්න යන අය විසින් සාදන ලද 2003 මැයි 22 දාතම හා අංක 497 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණය කොට ලොට් A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : එම ඉඩමේ ලොට් 2, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 5 (අඩි 8 පළල පාර) සහ එම ඉඩමේ ලොට් 4 C (අඩි 4 පළල පාර), දකුණට : පිඹුරු අංක 244 හි ලොට් 2 සහ ගාල්ල සිට මාතර දක්වා මහා මාර්ගය සහ බස්නාහිරට : එම ඉඩමෙන් කොටසක් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසි අටයි දශම තුනක් (අක්. 0, රූ. 1, පර්. 28.3) විශාල ඉඩම් කොටස සමග සම්පූර්ණයෙන්ම පස, ගහකොල වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 497 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව D860/328 යටතේ මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

ඉහතින් දක්වා ඇත්තේ පහත සඳහන් ඉඩම් කොටස් තුනේ ඒකාබද්ධයන් නැවත මිනුමකි.

එකී තල්අරඹ හි පිහිටි "ඉදිගහවත්ත හි ලොට් 4 හි 4 A හි උපබෙදුම" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. ආර්. කුලරත්න යන අය විසින් සාදන ලද 1999 නොවැම්බර් 17 දාතම හා අංක 244 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : එම ඉඩමේ ලොට් 4B, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 2, දකුණට : ගාල්ල සිට මාතර දක්වා මහා මාර්ගය සහ බස්නාහිරට : එම ඉඩමේ කොටසක් යන මායිම් තුල පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහලොවක් (අක්. 0, රූ. 0, පර්. 15) විශාල ඉඩම් කොටස සමග සම්පූර්ණයෙන්ම පස, ගහකොල වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ එකී අංක. 244 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව D860/320 යටතේ මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී තල්අරඹ හි පිහිටි "ඉදිගහවත්ත හි ලොට් 4 හි හි උපබෙදුම" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. ආර්. කුලරත්න යන අය විසින් සාදන ලද 1999 ඔක්තෝබර් මස 26 දාතම හා අංක 241 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 4 B වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එම ඉඩමේ ලොට් 3, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 4 C (අඩි 4 පළල පාර) දකුණට : පිඹුරු අංක 244 හි ලොට් 1 සහ 2 සහ බස්නාහිරට : එම ඉඩමේ කොටසක් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහයි දශම හතයි බිංදුවක් (අක්. 0, රූ. 0, පර්. 5.70) විශාල ඉඩම් කොටස සමග සම්පූර්ණයෙන්ම පස, ගහකොල වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ එකී අංක 241 දරන පිඹුරට අනුව වෙළුම /පත්ඉරුව D1045/232 යටතේ මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී තල්අරඹ හි පිහිටි "ඉදිගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. සිරිවර්ධන යන අය විසින් සාදන ලද 1988 මාර්තු 09 දාතම හා අංක 41/1988 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණය කොට ලොට් 3 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : එම ඉඩමේ ලොට් 2, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 5 (අඩි 8 පළල පාර), දකුණට : එම ඉඩමේ ලොට් 4 B සහ බස්නාහිරට : එම ඉඩමේ කොටසක් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් හතයි දශම හයයි බිංදුවක් (අක්. 0, රූ. 1, පර්. 7.60) විශාල ඉඩම් කොටස සමග සම්පූර්ණයෙන්ම පස, ගහකොල වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ එකී අංක 41/1988 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව D860/311 යටතේ මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දෑ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය :

එකී තල්අරඹ හි පිහිටි "ඉදිගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. සිරිවර්ධන යන අය විසින් සාදන ලද 1988 මාර්තු මස 09 දාතම හා අංක 41/1988 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 5 (අඩි 8 පළල පාර) වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : එම ඉඩමේ ලොට් 2, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 1, දකුණට : වල්ගම සිට මාතර දක්වා ප්‍රධාන පාර සහ බස්නාහිරට : එම ඉඩමේ ලොට් 3 සහ 4 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් අටයි දශම පහක් (අක්. 0, රූ. 0, පර්. 8.5) විශාල ඉඩම් කොටස එකී අංක 41/1988 දරන පිඹුරට අනුව වෙළුම/පත් ඉරුව D860/330 යටතේ මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී තල්අරඹ හි පිහිටි "ඉදිගහවත්ත හි ලොට් 4 හි උපබෙදුම" යයි කියනු ලබන ඉඩමට බලයලත් ලත් මානක තැන ඩබ්ලිව්. ආර්. කුලරත්න යන අය විසින් සාදන ලද 1999 ඔක්තෝබර් 26 දාතම හා අංක 241 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 4 C (අඩි 4 පළල පාර) වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට: එම ඉඩමේම ලොට් 3, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 5 (අඩි 8 පළල පාර), දකුණට : ගාල්ල සිට මාතර දක්වා ප්‍රධාන පාර සහ බස්නාහිරට : එම ඉඩමේ ලොට් 4 A යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් එකයි දශම නවයක් (අක්. 0, රූ. 0, පර්. 1.9) විශාල ඉඩම් කොටස එකී අංක 241 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව D1045/233 යටතේ මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී උකස් බැඳුම්කර අංක 610 මතින් හා ඒ යටතේ උකස්කොට ඇපකොට ඇත.

2. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ මාතර ග්‍රැවට් 4 සහ මහ නගර සභා සීමාවන් තුළ පඹුරන පිහිටි අනගාරික ධර්මපාල මාවත, (පැරණි වරිපනම් අංක 376), වරිපනම් අංක 382 සහ 384 දරන "ගොඩකඳුරුගහවත්ත නොහොත් මහකොරටුව වශයෙන් ද හඳුන්වනු ලබන ගොඩකඳුරුගහ නොහොත් මහකොරටුව ලොට් A හි ලොට් C සහ ගොඩකඳුරුගහපිට්ටනිය නොහොත් මහකොරටුව (හෝ ගොඩකඳුරුගහපිට්ටනිය *නොහොත්* මහකොරටුව) හි ලොට් A හි ලොට් B බෝගහවත්ත හි කොටසක් සහ රාළහාමින්නේ වත්ත ලොට් A රාලහාමින්නේවත්ත ලොට් B හි ලොට් 5, රාලහාමින්නේවත්ත හි ලොට් B හි ලොට් D හෝ 4 යන යාබද ලොට් හි ලොට් 6 හි 6D, 6E, සහ 6F හි ඒකාබද්ධකිරීමක්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. එම්. අබේගුණවර්ධන යන අය විසින් සාදන ලද 2004 අගෝස්තු 31 දාතම හා අංක 239 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : එම ඉඩමේ ලොට් 5, නැගෙනහිරට : මහ නගර සභා පාර, දකුණට : ලොට් 6A, 6B, සහ 6C සහ බස්නාහිරට : රාලහාමින්නේවත්ත යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි දෙකයි දශම අටක් (අක්. 0, රූ, 0, පර්. 22.8) විශාල ඉඩම් කොටස

සමග සම්පූර්ණයෙන්ම පස, ගහකොල, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 239 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව A469/207 යටතේ මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී උකස් බැඳුම්කර අංක 659, 1135 සහ 1207 මතින් හා ඒ යටතේ උකස්කොට ඇපකොට ඇත.

3. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර ග්‍රැවට් 4 සහ නගර සභා සීමාවන් තුළ වල්ගම පිහිටි අනගාරික ධර්මපාල මාවත, වරිපනම් අංක 14 (1) දරන "අත්තලයිවත්ත *නොහොත්* ගෙදරවත්ත හි ලොට් A හි ලොට් 4 යයි කියනු ලබන (බලයලත් මානක තැන එච්. ජේ. සමරපාල යන අය විසින් සාදන ලද 1997 අගෝස්තු 20 දාතම හා අංක 899 දරන පිඹුරේ නිරූපිත ලොට් 4A සහ 4B හි ඒකාබද්ධකිරීමක් හා නැවත මිනුමක් වන) ඉඩමට බලයලත් මානක තැන පී.එම්. අබේගුණවර්ධන යන අය විසින් සාදන ලද 2006 ඔක්තෝබර් 26 දාතම හා අංක 346 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : ගාල්ල සිට මාතර දක්වා ප්‍රධාන පාර, නැගෙනහිරට : පිඹුරු අංක 899 හි ලොට් B (නිවාස වලට පාර), දකුණට : පිඹුරු අංක 899 හි ලොට් C සහ බස්නාහිරට : එම ඉඩමේ ලොට් 1, 2 සහ 3 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම නමයයි පහක් (අක්. 0, රූ. 0, පර්. 10.95) විශාල ඉඩම් කොටස සමග සම්පූර්ණයෙන්ම පස, ගහකොල, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 346 දරන පිඹුරට අනුවය.

එකී ලොට් 1 පහතින් විස්තර කොට ඇති පරිදි සම්පූර්ණයෙන් ම ලොට් 4A සහ 4B හි ඒකාබද්ධ කිරීමේ නැවත මිනුමකි :-

එකී වල්ගම පිහිටි "අත්තලයිවත්ත *නොහොත්* ගෙදරවත්ත හි ලොට් A හි ලොට් 4" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානකතැන එච්. ජේ. සමරපාල යන අය විසින් සාදන ලද 1997 අගෝස්තු 20 දාතම හා අංක 899 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 4 A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ගාල්ල සිට මාතර දක්වා ප්‍රධාන පාර, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් B (අඩි 15 පළල පාර), දකුණට : අත්තලායිවත්ත *නොහොත්* ගෙදරවත්ත හි ලොට් C සහ බස්නාහිරට : අත්තලයිවත්ත *නොහොත්* ගෙදරවත්ත හි ලොට් 4B සහ ලොට් A හි ලොට් 2 සහ 3 යන මායිම් තුල පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම හයයි තුනයි බිංදුවක් (අක්. 0, රූ. 0, පර්. 10.630) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොල, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ එකී අංක 899 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව A499/199 යටතේ එම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී වල්ගම පිහිටි "අත්තලයිවත්ත" *නොහොත්* ගෙදරවත්ත හි ලොට් A හි ලොට් 4" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානකතැන එච්. ජේ. සමරපාල යන අය විසින් සාදන ලද 1997 අගෝස්තු 20 දාතම හා අංක 899 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 4 B වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : එම ඉඩමේ ලොට් 2, නැගනෙහිරට : එම ඉඩමේ ලොට් 4 A, දකුණට : අත්තලයිවත්ත *නොහොත්* ගෙදරවත්ත හි ලොට් C සහ බස්නාහිරට : අත්තලයිවත්ත *නොහොත්* ගෙදරවත්ත හි ලොට් A හි ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් එකක් (අක්. 0, රූ. 0, පර්. 1) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොල, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ එකී අංක 899 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව A499/200 යටතේ මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී අංක 1205 දරන උකස් බැඳුම්කරය මගින් හා ඒ යටතේ උකස්කොට ඇපකොට ඇත.

4. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ මාතර ග්‍රැවට් 4 සහ නගර සභා සීමාවන් තුළ හිත්තටිය පිහිටි මීරා පාර, වරිපනම් අංක 83 දරන "කහම්පලේ කුරුඳුවත්ත *නොහොත්* ඊසාදීන් නගරය" යැයි කියනු ලබන (බලයලත් මානකතැන බී. අත්තනායක යන අය විසින් සාදන ලද 1987 මාර්තු මස 22 දාතම හා අංක 1000 දරන පිඹුරේ නිරූපිත ලොට් 20 හි නැවත මිනුමක් වන) ඉඩමට බලයලත් මානකතැන පී. එම්. අබේගුණවර්ධන යන අය විසින් සාදන ලද 2004 අප්‍රේල් 04 දාතම හා අංක 280 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කොට සීමා නිර්ණකොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති සහ (වරිපනම් අංක 79 දරන) ඉඩම් කොටසට මායිම් : උතුරට : මීරා පාර නැගෙනහිරට : පිඹුරු අංක 1230 හි ලොට් 18 (වරිපනම් අංක 79 දරන) දකුණට : පාර සඳහා වෙන් කිරීම (අඩි 10 පළල පාර) සහ බස්නාහිරට : පිඹුරු අංක 1230 හි ලොට් 22 (වරිපනම් අංක 87 දරන) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් අටක් (අක්. 0, රූ. 1, පර්. 8) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොල, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 280 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව A 467/50 යටතේ මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී අංක 1153 දරන උකස් බැඳුම්කරය මගින් හා ඒ යටතේ උකස්කොට ඇපකොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

08-716/1

---

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

ජී. වික්‍රමසේකර

ගිණුම් අංක : 0068 5000 0997

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2009 ක් වූ ජූලි මස 28 දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව බැඳුම්කර අංක 411 ප්‍රකාර රුපියල් පනස් හත්ලක්ෂ අනූපන් දහස් හාරසිය අසූතුනයි ශත තිස්අටක (රු. 57,95,483.38) මුදලක් 2009 ජූලි මස 11 වැනි දින සිට අංක 411 දරන එකී බැදුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පනස් තුන්ලක්ෂ අනූතුන් දහස් හත්සිය හතලිස් දෙකයි ශත විසිඑකක (රු. 53,93,742.21) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහලවක් (15%) බැගින් වූ පොලිය ද, හා ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2009.09.11 දින රජයේ *ගැසට් පත්‍රයේ* 2009.08.28 දින දිවයින, අයිලන්ඩ් සහ තිනකුරන් දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පලකොට ඇති පරිදි 2010.09.20 දින පෙ. ව. 9.30 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළේ, මැද පත්තුවේ ගම්පහ නගර සභා සීමාවන් තුළ (යක්කල උප කාර්යාලය) කෙසෙල්වතුගොඩ ග්‍රාමයේ පිහිටි කුරුණෑගල වත්ත පාර, වරිපනම් අංක 39-41 දරන යක්කල එස්ටේට් හි කොටසක් යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානකතැන ජේ. පී. එන්. ජයසුන්දර විසින් සාදන ලද 2006 ඔක්තෝබර් මස 15 දාතම හා අංක 6210 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : නිහාල් ඩික්සන් රාජපක්ෂ සහ එඩ්වඩ් රනිල් ජයතිලක යන අයගේ උරුමක්කාරයින්ගේ සහ අඟුරු හෙට්ටිආරච්චිලාගේ උපාලි යන අයගේ ඉඩම්, නැගෙනහිරට : එඩ්වඩ් රනිල් ජයතිලක සහ නිහාල් ඩික්සන් රාජපක්ෂ යන අයගේ උරුමක්කාරයින්ගේ ඉඩම සහ පාර (මහ නගර සභා) දකුණට : පාර (මහනගර සභා) සහ පාර (අඩි 10 හෝ මීටර් 3.05 පළල) සහ බස්නාහිරට: පාර (අඩි 10 හෝ මීටර් 3.05 පළල) සහ කේ. කේ. කේ. විජේසුන්දර සහ වෙනත් අයගේ සහ අඟුරු හෙට්ටිආරච්චිලාගේ උපාලි යන අයගේ ඉඩම් සහ මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් තිස් පහයි දශම හයක් (අක්. 0 රූ. 1, පර්. 35.6) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී පිඹුරු අංක 6210 ට අනුව වෙලුම/පත්ඉරුව ජී 49/132 හි ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

08-716/3

---

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

කේ. ඒ. මනුරි

ගිණුම් අංක : 1052 5318 0688

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2009 ක් වූ දෙසැම්බර් මස 17 දින සීමාසහිත සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් තුන් ලක්ෂ දොලොස් දහස් නමසිය හතයි ශත අසූ එකක (රු. 3,12,907.81) මුදල ද, 2009 ඔක්තෝබර් මස 29 දින සිට අයවිය යුතු මුලු මුදල පියවනු ලබන දිනය තෙක් රුපියල් දෙලක්ෂ හැට දෙදහස් හාරසිය හැත්තෑ තුනයි ශත තිස් හතක (රු. 2,62,473.37) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහලවක් (15%) බැගින් වූ පොලිය ද හා ප්‍රචාරණ වියදම් ද දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2010.04.09 දින රජයේ *ගැසට් පත්‍රයේ* 2010.04.19 දින "දිවයින", " අයිලන්ඩ්" සහ "තිනකුරල්" දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පලකොට ඇති පරිදි 2010.09.16 දින ප. ව. 2.30 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ, මැද පත්තුවේ මීගොඩ ග්‍රාමයේ පිහිටි "කීනගහලන්ද' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ. ඩී. විතාන යන අය විසින් සාදන ලද 2006 අප්‍රේල් මස 19 දාතම හා අංක 1540 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 2 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : මෙහි ලොට් 1 සහ 3, නැගනෙහිරට පාර (ප්‍රාදේශීය සභා), දකුණට අංක 5154 දරන පිඹුරේ ලොට් 1 සහ බස්නාහිරට අංක 5154 දරන පිඹුරේ ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ හතරයි දශම දෙකයි හතක් (අක්. 0 රූ. 0 පර්. 14.27) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 1540 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව 317/219 යටතේ අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අංක 1540 දරන පිඹුරේ ලොට් 3 දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

08-716/2

---

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වෙනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

එච්. කේ. ඒ. කුමාර

ගිණුම් අංක : 1069 5301 1829

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2010 මාර්තු 25 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් තුන් ලක්ෂ දොලොස් දහස් නමසිය හැට නමයයි ශත විසි හතක (රු. 3,12,969.27) මුදලද 2010 පෙබරවාරි මස 02 දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දෙලක්ෂ අසූ අට දහස් නමසිය අනූ හතයි ශත එකක (රු. 288,997.01) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයක් (16%) බැගින් වූ පොලිය ද හා ප්‍රචාරණ වියදම් ද දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2010.06.11 දින රජයේ *ගැසට් පත්‍රයේ*, 2010.06.08 දින "දිවයින" "අයිලන්ඩ්" සහ "තිනකුරල්" දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2010.09.20 දින ප.ව. 2.30 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාවන් තුල පිටිපන ග්‍රාමයේ පිහිටි " ගල්පොත්තකැලේ" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානකතැන ඩබ්ලිව්. ඩී. එම්. ජේ. රූපසිංහ යන අය විසින් සාදන ලද 2001 ජූලි මස 28 දාතම හා අංක 2079 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 3 එෆ් වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ලොට් 3 සී, නැගෙනහිරට : අංක 1067 දරන පිඹුරේ ලොට් 4 දකුණට : එම්. ඩී. පියසේන සහ වෙනත් අය විසින් හිමිකම් කියනු ලබන ගල්පොත්තකැලේ ඉතිරි කොටස සහ බස්නාහිරට : අංක 1067 දරන පිඹුරේ ලොට් ආර් වඩා නිවැරදිව ලොට් 02 යන මායිම් තුල පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයක් (අක්. 0, රූ. 0, පර්. 10) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 2079 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව ජී 1712/20 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දෑ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගයඃ-

අංක 2329 දරන එකී පිඹුරේ ලොට් ආර් (අඩි 15ක් පළල පාර සඳහා වෙන්කිරීම) පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව ජී 179/102 යටතේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

08-716/5

---

**ලංකා බැංකුව**

ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 22 වැනි වගන්තිය යටතේ වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2010.04.23 දිනැති අංක PA/AD 4/2820 දරන *ගැසට් පත්‍රයේ* හා 2010.04.22 දිනැති දිනමිණ, ඩේලිනිවුස් හා තිනකරන් යන පුවත්පත්වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගත හැකි මුල් මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අය විය යුතු පොලිය ද, ගාස්තු හා මුදල් ද අයකරගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර පිහිටි ස්ථානයේ දී ම 2010.11.20 වැනි දින පෙ. ව. 11.30 ට කොළොන්නාව, විහාර මාවත, අංක 50/3 හි පදිංචි T & H ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

**විකිණීමට ඇති දේපළ**

**පළමුවැනි උපලේඛනය**

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සීමාවේ අංක 38 කොට්ඨාසයෙහි බම්බලපිටිය පිහිටි කොළඹ 03, ගාලු පාරේ වරිපනම් අංක 385 - 10/3 දරන "ලැන්ඩ්මාක්" නමැති සහාධිපත්‍ය දේපළට එහි ඇති ගොඩනැගිලි සහිතව බලයලත් මිනින්දෝරු එම්. සී. එල්. සී. පෙරේරා විසින් සාදන ලද 2000 සැප්තැම්බර් මස 01 වැනි දිනැති අංක 32/2000 දරන සහාධිපත්‍ය පිඹුරෙහි නිරූපිත දහවන මහලෙහි සහාධිපත්‍ය ඒකක 19 එනම් එකී සහාධිපත්‍ය ඒකක 19 උතුරට CE (4) හි විවෘත අවකාශය සහිත මෙම ඒකකය සමග OSCE 8B අතර බිත්තියෙහි මධ්‍යය ද, නැගෙනහිරටඃ මෙම ඒකකය සමග CE (12) හි විවෘත අවකාශය අතර බිත්තියෙහි මධ්‍යය ද, දකුණටඃ මෙම ඒකකය සමග SW (1), CE (30) LF (1) සහ CE (3 B) අතර බිත්තියේ මධ්‍යය ද, බස්නාහිරට : මෙම ඒකකය සමග SW (2) CE (3O) සහ OSCE (8 B) අතර බිත්තියෙහි මධ්‍යය ද, මුදුනට CE (34) වහලය සේ ඇති තට්ටුවේ බිමෙහි සහ ආසන සහිත ඉහල ශාලාවෙහි CE(33) මැද ද, පහත් ම ස්ථානය ලෙස මෙම ඒකකයෙහි බිමෙහි මධ්‍යය ද මායිම් වර්ග මීටර් එකසිය හයක (ව. මී. 106) බිම් ප්‍රදේශයකින් සමන්විත වන අතර, මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ Con A 88/61 හි ලියාපදිංචි කර ඇත.

මෙම ඒකකයට සදළුතල විසිත්ත සහ කෑම කාමර, නිදන කාමර, මුළුතැන් ගෙය, ගබඩා කාමරය, නාන කාමරය සහ වැසිකිළි ද ඇත.

සහාධිපත්‍ය දේපළෙහි මෙම ඒකකයෙහි වටිනාකමෙන් නොබෙදූ කොටස 1.69%ක් වේ.

මෙම ඒකකයට ආසන්නතම පොදු ප්‍රවේශ ප්‍රදේශය CE (30), LF (2) SW (1) සහ SW (2) හි සිටය.

**දෙවැනි උපලේඛනය**

*පොදු මූලිකාංග.-*

1. 1982 අංක 45 දරන (සංශෝධිත) 26 වැනි ඡේදයේ 12 වැනි වගන්තියෙන් සංශෝධනය කර ඇති ආකාරයට 1973 අංක 11 දරන අනුනිවාස හිමිකම් නීතියෙහි ඔප්පුකර ඇති ආකාරයට සහාධිපත්‍ය දේපළෙහි ව්‍යවස්ථාපිත පොදු මූලිකාංග.

(අ) සහාධිපත්‍ය දේපළට අනුබද්ධ විවෘත අවකාශය ඇතුළත්ව ගොඩනැගිල්ල පවතින ඉඩම.

(ආ) අත්තිවාරම, කුළුණු, ගේඩර, තලාද, ආධාරක ප්‍රධාන බිත්ති සහ ගොඩනැගිල්ලේ වහලය.

(ඇ) පොදු සේවාවන් සඳහා සවිකර ඇති විදුලිය, දුරකථන, ගුවන් විදුලිය, පුනර් විස්තාරය, රූපවාහිනිය, ජලනල, ජලටැංකි, වැඩිපුර ඇති වතුර රැස්වන වල, උඩ පිහිටි වතුර ටැංකි, පොම්පාගාරය, පල්දෝරු නල මාර්ගය, මනු සිදුරු සහ අපද්‍රව්‍ය බැහැර කිරීම.

(ඈ) දේපළෙහි පැවැත්ම නඩත්තුව හා ආරක්ෂාවට අවශ්‍ය හෝ එය පහසුකරවන හෝ සාමාන්‍යයෙන් පොදුවේ භාවිතාවන දේපළ වල පහසුකම් සහ වෙනත් සියලු කොටස්.

(2) ඉහත සටහන් කර සහ විස්තර කර ඇති පොදු මූලිකාංගවල අර්ථ දැක්වීම සහ විස්තරය :

| | | | |
|---|---|---|---|
| 1. | CE (1) | *(අ)* | එය පාමහලෙහි ඇති ජලය සහ ගින්දර සඳහා වූ පොම්පාගාරය සහ ඉන්ධන ගබඩාව වේ. |
| | | *(ආ)* | මෙය විශේෂයෙන් ම භාවිතා කෙරෙනුයේ ලැන්ඩ්මාක් ගොඩනැගිල්ලේ නඩත්තුව සඳහායි. |
| 2. | CE (2) | *(අ)* | මෙය පාමහලෙහි ඇති ඉන්ධන ගබඩාව සහිත විදුලි උත්පාදන (ජෙනරේටර්) කාමරය සහ ප්‍රධාන විදුලි පාලක මැදිරිය ද වේ. |
| | | *(ආ)* | මෙය විශේෂයෙන් ම භාවිතා කෙරෙනුයේ ලැන්ඩ්මාක් ගොඩනැගිල්ලේ නඩත්තුව සඳහා ය. |
| 3. | CE (3) | *(අ)* | එය ඇවිදීම සඳහා වූ පථය මෙන් ම ධාවන පථයක් ලෙස භාවිතා කරන පාමහල සහ ඉඩම ය. |
| | | *(ආ)* | මෙය ඒකක 19 ට වෙන්කළ අදාළ ඒකක සඳහා කලින් වෙන් කරන ලද P2, P3, P4, P5, P6, P7, P8, P9, P10, P11, P12, P13, P14, P15, P16, P17, නම් වූ වාහන නවත්වන ස්ථානවලට සුවිශේෂීව ඇවිදයාමට හා වාහන පදවා ගෙන යා හැකි මාර්ගයකි. |
| 4. | CE (3A) | *(අ)* | එය පල්දෝරු නලයකි. වායුසමීකරණ, C අයිතමයෙහි සඳහන් කළ ආකාරයට විදුලි හා අනෙකුත් සේවා සඳහා වූවෙකි. |
| 5. | CE (3B) | *(අ)* | C අයිතමයෙහි සඳහන් කරන ලද වායුසමීකරණ, ගිනි, විදුලි, වෙනත් සේවා සඳහා වූ නලයකි. |
| 6. | CE (12) | *(අ)* | ඇවිදීම සඳහා බිම මත පිහිටි මාර්ගය සහිත ඉඩමකි. එසේ ම පාමහලෙහි නවතනු ලබන වාහන පදවාගෙන යන ධාවන පථයකි |
| | | *(ආ)* | එළිමහන් ප්‍රදේශය ගොඩනැගිල්ලට වාතාශ්‍රය සැපයීම සඳහා යොදා ගැනේ. |
| | | *(ඇ)* | එය පා මහල සඳහා පොදු ප්‍රවේශයයි. |
| 7. | SW(1) | *(අ)* | එය පා මහලෙහි සිට 11 වන මහල දක්වා වූ තරප්පු පෙළකි. |
| | | *(ආ)* | එය 11 මහලේ සිට පාමහලට හදිසි ගින්නකදී පිටවීම සඳහා භාවිතා කරනු ලැබේ. |
| 8. | SW(2) | *(අ)* | එය බිම්මහලෙහි සිට 11 වැනි මහල දක්වා වූ තරප්පු පෙළකි. |
| | | *(ආ)* | එය 11 වැනි මහලේ සිට බිම්මහල දක්වා හදිසි ගින්නක දී පිටවීමට භාවිතා කෙරේ. |
| 9. | SW(3) | *(අ)* | එය පළමු මහලේ සිට තුන්වන මහල දක්වා වූ තරප්පු පෙළකි. |
| | | *(ආ)* | එය සුවිශේෂීව පළමු මහලේ සිට තුන්වන මහල දක්වා දිනපතා භාවිතය සඳහා ය. |
| 10 | EC(1) | (අ) | එය විදුලි සෝපාන පඩිපෙල සඳහා වූ අවකාශයයි. |
| | | (ආ) | මෙය සුවිශේෂීව බිම් මහලේ සිට තුන්වල මහල දක්වා භාවිතා කරන විදුලි සෝපාන පඩිපෙල සඳහා භාවිතා වේ. |
| 11. | LF(1) | (අ) | එය විදුලි සෝපානය සඳහා වූ අවකාශයයි. |
| | | (ආ) | එය පාමහලෙහි සිට 11 වන මහල දක්වා වූ කාර්යාල විදුලි සෝපානය සඳහා භාවිතා කෙරේ. |
| | | (ඇ) | මෙම විදුලි සෝපානය සුවිශේෂීව පාමහලේ සිට 6 වන මහල දක්වා භාවිතා කෙරේ. හදිසි අවස්ථාවකදී හෝ නේවාසිකාගාර විදුලි සෝපානය සේවා යටතේ ඇති විට සියළුම මහල් සඳහා භාවිතා කෙරේ. |
| 12. | LF(2) | (අ) | එය විදුලි සෝපාන අවකාශයයි |
| | | (ආ) | එය පාමහලෙහි සිට 11 වන මහල දක්වා වූ නේවාසිකාගාර විදුලි සෝපානය සඳහා භාවිතා කෙරේ. |
| | | (ඈ) | මෙම විදුලි සෝපානය පාමහල, බිම් මහල, හත්වන මහලේ සිට 11 වන මහල දක්වා සුවිශේෂීව භාවිතා කෙරේ. හදිසි අවස්ථාවකදී හෝ කාර්යාල විදුලි සෝපානය සේවා යටතේ පවතිනවිට සියළු මහල් සඳහා භාවිතා කෙරේ. |
| 13. | CE(4) | (අ) | එය ඉඩම සහ ගොඩනැගිල්ලේ බිම් මහලය |
| | | (ආ) | විවෘත අවකාශය ගොඩනැගිල්ලේ උතුරු හා බස්නාහිර පැතිවල වාතාශ්‍රය සඳහාය |
| 14. | OSCE(4A) | (අ) | එය ගොඩනැගිල්ලේ නිරිතදිග කොණෙහි බිම් මහලට ඉහලින් ඇති විවෘත අවකාශය වේ |
| | | (ආ) | ගොඩනැගිල්ලේ වාතාශ්‍රය සඳහා විවෘත අවකාශය යොදා ගැනේ. |
| 15. | CE(5) | (අ) | එය බිම්මහලෙහි ට්‍රාන්ස්පෝමර මැදිරියකි |
| | | (ආ) | මෙය සුවිශේෂීව භාවිතා කරන්නේ ලැන්ඩ්මාක් ගොඩනැගිල්ලෙහි නඩත්තුව සඳහාය |
| 16 | CE(6) | (අ) | එය බිම් මහලෙහි කොරිඩෝවක් සහ පැසේජයකි |
| | | (ආ) | එය සුවිශේෂීව බිම් මහලෙහි ප්‍රයෝජනය සඳහාය |
| 17 | CE (6A) | (අ) | එය කැළිකසල බැහැර කිරීමේ මැදිරියයි |
| | | (ආ) | එය සුවිශේෂීව ලැන්ඩ්මාක් ගොඩනැගිල්ලේ නඩත්තුව සඳහා භාවිතා කෙරේ |
| 18 | CE(6C) | (අ) | එය බිම් මහල සඳහා සුවිශේෂීව භාවිතා කරනු ලබන වායුසමීකරණ යන්ත්‍ර සඳහා භාවිතා කෙරේ. |
| 19. | CE(6D) | (අ) | එය බිම් මහල සඳහා සුවිශේෂීව භාවිතා කරනු ලබන වායුසමීකරණ යන්ත්‍ර සඳහා භාවිතා කෙරේ. |
| 20 | CE(6E) | (අ) | එය බිම් මහල සඳහා සුවිශේෂීව භාවිතා කරනු ලබන වායුසමීකරණ යන්ත්‍ර සඳහා භාවිතා කෙරේ. |
| 21. | CE(7) | (අ) | එය බිම් මහලෙහි කොරිඩෝව සහ පැසේජයක් වන අතර, කාර්යාල ප්‍රවේශ ශාලාවක් ලෙසද භාවිතාවේ. |
| | | (ආ) | එය සුවිශේෂීව ගොඩනැගිල්ලේ ඒකක 1 සිට ඒකක 4දක්වා, ඒකක 21 සහ 12 වන මහලෙහි ප්‍රයෝජනය සඳහාය. හදිසි අවස්ථාවකදී ගොඩනැගිල්ලේ සියළු මහල් වල ප්‍රයෝජනය සඳහා |
| 22 | CE(7A) | (අ) | එය ලැන්ඩ්මාර්ක් ගොඩනැගිල්ලෙහි නඩත්තුව සඳහා සුවිශේෂී ලෙස භාවිතා කරනු ලබන ආරක්ෂාව, පාලනය සහ උපකරණ මැදිරිය වේ. |
| 23 | CE(8) | (අ) | එය ප්‍රධාන ප්‍රවේශ ශාලාව සහ ලැන්ඩ්මාර්ක් ගොඩනැගිල්ලේ දොරටුව වේ. |
| | | (ආ) | එය ගොඩනැගිල්ලේ භූමියට, 1 වන මහලේ සිට 6 වන මහල දක්වා ඇතුල්වීම සඳහා සුවිශේෂීව භාවිතා කෙරේ. |
| 24 | CE(9) | (අ) | එය බිම්මහලෙහි කොරිඩෝව සහ පැසේජය වන අතර, නේවාසිකාගාර ප්‍රවේශ ශාලාව ලෙස භාවිතා කෙරේ. |
| | | (ආ) | එය ගොඩනැගිල්ලේ ඒකක 5 සිට 21 දක්වා සුවිශේෂීව භාවිතා කෙරේ. යම් හදිසි අවස්ථාවකදී ගොඩනැගිල්ලේ සියළු මහල් වල භාවිතය සඳහා |
| 25 | CE(9A) | (අ) | එය ලැන්ඩ්මාක් ගොඩනැගිල්ලේ නඩත්තුව සඳහා භාවිතා කරනු ලබන පල්දෝරු නලයකි. |
| 26 | CE(10) | (අ) | එය පලමු මහල සඳහා සුවිශේෂීව භාවිතා කරනු ලබන වායුසමීකරණ යන්ත්‍රසූත්‍ර මැදිරියයි. |
| 27 | CE(10A) | (අ) | එය පළමු මහල සඳහා සුවිශේෂීව භාවිත කරනු ලබන වායුසමීකරණ යන්ත්‍රසූත්‍ර මැදිරියයි. |

| | | | |
|---|---|---|---|
| 28 | CE(11) | (අ) | එය පළමු මහලේ සිට 6 වන මහල දක්වා සුවිශේෂීව භාවිතා කරනු ලබන පළමු මහලේ ඒකක 1 සඳහා භාවිතා කරන ප්‍රවේශ ශාලාවයි. |
| 29 | OSCE(12) | (අ) | එය ගොඩනැගිල්ලේ නැගෙනහිර පැත්ත සඳහා භාවිතා කරනු ලබන එළිමහන් ප්‍රදේශයයි. |
| 30 | CE(13) | (අ) | එය පළමු මහලේ සිට 6 වන මහල දක්වා සුවිශේෂිව භාවිතා කරනු ලබන ගොඩනැගිල්ලෙහි දෙවැනි මහලෙහි ප්‍රවේශ ශාලාවයි. |
| 31 | CE(13A) | (අ) | එය ගොඩනැගිල්ලේ දෙවන මහල සඳහා සුවිශේෂිව භාවිතා කරනු ලබන වායුසමීකරණ යන්ත්‍රසූත්‍ර සඳහා භාවිතා කරන මැදිරියකි. |
| 32 | CE(13B) | (අ) | එය ගොඩනැගිල්ලේ දෙවන මහල සඳහා සුවශේෂිව භාවිතා කරනු ලබන වායුසමීකරණ යන්ත්‍රසූත්‍ර සඳහා භාවිතා කරන මැදිරියකි. |
| 33 | OSCE(8) | (අ) | එය ගොඩනැගිල්ලෙහි ඒකක 1 සඳහා සුවිශේශීව භාවිතා වන බිම් මහලට ඉහලින් තුන්වන මහලේ සිවිලම දක්වා වූ විවෘත අවකාශයයි. |
| 34 | OSCE | (8A) | (අ) එය බිම් මහලෙහි බස්නාහිර දෙසට වූ ගොඩනැගිල්ලෙහි වාතාශ්‍රය සඳහා විවෘත අවකාශයයි. |
| 35 | OSCE(8B) | (අ) | එය උතුරු පැත්තෙහි බිම් මහලට ඉහලින් පිහිටි ගොඩනැගිල්ලෙහි වාතාශ්‍රය සඳහා භාවිතා කරන විවෘත අවකාශයයි. |
| 36 | CE(14) | (අ) | එය 1 සිට 6 මහල දක්වා සුවිශේෂිව භාවිතා කරන ගොඩනැගිල්ලෙහි තුන්වන මහලෙහි පිහිටි ප්‍රවේශ ශාලාවයි. |
| 37 | CE(15) | (අ) | එය තුන්වන මහල සඳහා සුවිශේෂිව භාවිතා කරන වායුසමීකරණ යන්ත්‍රසූත්‍ර සඳහා භාවිතාවන මැදිරියයි. |
| 38 | CE(15A) | (අ) | එය තුන්වන මහල සඳහා සුවිශේෂිව භාවිතා කරන වායුසමීකරණ යන්ත්‍රසූත්‍ර සඳහා භාවිතා වන මැදිරියයි. |
| 39 | CE(16) | (අ) | එය 4 වන මහලේ ප්‍රවේශ ශාලාව වන අතර, 4 වන මහල සඳහා සුවිශේෂිව භාවිතා කරනු ලබයි. |
| 40 | CE(17) | (අ) | එය හතරවන මහල සඳහා සුවිශේෂිව භාවිතා කරන වායුසමීකරණ යන්ත්‍රසූත්‍ර සඳහා භාවිතාවන මැදිරියයි. |
| 41 | CE(17A) | (අ) | එය හතරවන මහල සඳහා සුවිශේෂිව භාවිතා කරන වායුසමීකරණ යන්ත්‍රසූත්‍ර සඳහා භාවිතාවන මැදිරියයි. |
| 42 | CE(18) | (අ) | එය 5 වන මහල සඳහා සුවිශේෂිව භාවිතා කරනු ලබන 5 වන මහලෙහි ප්‍රවේශ ශාලාවයි. |
| 43 | CE(19) | (අ) | එය පස්වන මහල සඳහා සුවිශේෂිව භාවිතා කරන වායුසමීකරණ යන්ත්‍රසූත්‍ර සඳහා භාවිතාවන මැදිරියයි. |
| 44 | CE(20) | (අ) | එය පස්වන මහල සඳහා සුවිශේෂිව භාවිතා කරන වායුසමීකරණ යන්ත්‍රසූත්‍ර සඳහා භාවිතාවන මැදිරියයි. |
| 45 | CE(21) | (අ) | එය හයවන මහල සඳහා සුවිශේෂිව භාවිතා කරන වායුසමීකරණ යන්ත්‍රසූත්‍ර සඳහා භාවිතා වන මැදිරියයි. |
| 46 | CE(22) | (අ) | එය ඒකක 4 සඳහා සුවිශේෂිව භාවිතා කරනු ලබන 6 වන මහලෙහි ප්‍රවේශ ශාලාවයි. |
| 47 | CE(23) | (අ) | එය හයවන මහල සඳහා සුවිශේෂිව භාවිතා කරන වායුසමීකරණ යන්ත්‍ර සත්‍ර සඳහා භාවිතාවන මැදිරියයි. |
| 48 | CE(24) | (අ) | එය 7 වන මහලෙහි ප්‍රවේශ ශාලාවයි |
| 49 | CE (26), CE (26A), CE (26B) CE(26C) | (අ) | මේවා Cඅයිතමයෙහි සඳහන් කරනලද සේවා නලයන්ය |
| 50 | CE(27), CE(27A) CE(27B) CE(26C) CE(27D) | (අ) | මේවා C අයිතමයෙහි සඳහන් කරන ලද සේවා නලයන්ය |
| 51 | CE(28) | (අ) | එය 8 වන මහලෙහි ප්‍රවේශ ශාලාවයි. |
| 52 | CE(29) | (අ) | එය 9 වන මහලෙහි ප්‍රවේශ ශාලාවයි. |
| 53 | CE(30) | (අ) | එය 10 වන මහලෙහි ප්‍රවේශ ශාලාවයි. |
| 54 | CE(31) | (අ) | එය 11 වන මහලෙහි ප්‍රවේශ ශාලාවයි. |
| 55 | CE(32) | (අ) | එය C අයිතමයෙහි සඳහන් සේවා නලයකි. |
| 56 | CE(32A) | (අ) | එය C අයිතමයෙහි සඳහන් සේවා නලයකි. |
| 57 | CE(33) | (අ) | එය එකොලොස්වන මහලෙහි වූ අහසට නිරාවරණය වූ සාලයකි. |
| | | (ආ) | එය පොදු විනෝදාශ්වාදය සඳහා වූ ප්‍රදේශයක් ලෙස යොදා ගැනේ. |
| 58 | CE(34) | (අ) | එය 11 වන මහලෙහි වූ මළුවකි |
| 59 | OSCE(34) | (අ) | එය එළිමහන් ප්‍රදේශයකි |
| 60 | OSCE(35A) | (අ) | එය එළිමහන් ප්‍රදේශයකි |
| 61 | OSCE(35B) | (අ) | එය එළිමහන් ප්‍රදේශයකි |
| 62 | CE(36), CE(36A) | (අ) | මේවා භාවිතා කරනු ලබන නලවලට ආලෝකය සඳහා සහ වාතාශ්‍රය සඳහා භාවිතා කරනු ලබන වා කවුළුය. |
| 63 | CE(40) | (අ) | එය ඒකක 18 හි සුවිශේෂී භාවිතය සඳහා වූ වා කවුළුය |
| 64 | SW(2A) | (අ) | එය ලැන්ඩ්මාර්ක් ගොඩනැගිල්ලට සුවිශේෂී වූ වහල මළුව දක්වා වූ තරප්පු පෙළකි. |
| 65 | OSCE(U5) | (අ) | එය ඒකක 5 හි සදළුතලයට ඉහලින් වූ වාතාශ්‍රය සඳහා භාවිතාවන එළිමහන් පෙදෙසකි. |
| 66 | OSCE(U8) | (අ) | එය ඒකක 8 හි සදළුතලයට ඉහලින් වූ වාතාශ්‍රය සඳහා භාවිතාවන එළිමහන් පෙදෙසකි. |
| 67 | CE (S1), CE (S2) | (අ) | මේවා ලැන්ඩ්මාර්ක් ගොඩනැගිල්ල සඳහා සුවිශේෂිතව භාවිතා කරන ගබඩා කාමර වේ. |
| 68 | CE (C1), CE (C2)CE (C3) CE (C4) | (අ) | මේවා ලැන්ඩ් මාර්ක් ගොඩනැගිල්ලේ සන්නිවේදන උපකරණ සහ ගබඩාව සඳහා සුවිශේෂිව භාවිතා වේ. |

III. 10 වන මහලෙහි ඒකක 19 ට අනුබද්ධ පොදු මූලිකාංග වල කොටස - නොබෙදුණු - 1.69%

ආර්. එම්. එස්. නුගේගොඩ,
ශාඛා කළමනාකරු.

ලංකා බැංකුව,
ලේක්හවුස් ශාඛාව.
08-670

---

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

DRF/21/RECT/3093.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බළ හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අපකීර්ති සහගත ලෙස සේවයෙන් ඉවත් කිරීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරි 2010 පෙබරවාරි මස 22 වැනි දින සිට අපකීර්ති සහගත ලෙස සේවයෙන් ඉවත් කරනු ලැබීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

තාවකාලික මේජර් ගල්හේනගේ චන්දන ප්‍රියංවදු, සබුබ (නි/62073)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010 මැයි මස 10 වැනි දින,
කොළඹ දී ය.
08-684

---

DRF/21/RECT/3095.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බළ හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අපකීර්ති සහගත ලෙස සේවයෙන් ඉවත් කිරීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරි 2009 ජූලි මස 14 වැනි දින සිට අපකීර්ති සහගත ලෙස සේවයෙන් ඉවත් කරනු ලැබීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

තාවකාලික කපිතන් ජයවීර මුදියන්සේලාගේ ඉන්දික පත්මකුමාර ජයවීර, ශ්‍රීලපාහ (නි/64751)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010 මැයි මස 10 වැනි දින,
කොළඹ දී ය.
08-661

---

DRF/21/RECT/3097.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බළ හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අපකීර්ති සහගත ලෙස සේවයෙන් ඉවත් කිරීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරි 2010 පෙබරවාරි මස 22 වැනි දින සිට අපකීර්ති සහගත ලෙස සේවයෙන් ඉවත් කරනු ලැබීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

ලුතිතන් වැගපිටිය විතාරනලාගේ දර්ශන වජිරනාත් කුලතුංග, ගැහේබ (නි/66138)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010 මැයි මස 10 වැනි දින,
කොළඹ දී ය.
08-692

---

DRF/21/RECT/3094.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බළ හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අපකීර්ති සහගත ලෙස සේවයෙන් ඉවත් කිරීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරි 2010 පෙබරවාරි මස 22 වැනි දින සිට අපකීර්ති සහගත ලෙස සේවයෙන් ඉවත් කරනු ලැබීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

තාවකාලික මේජර් නැකතගේ ප්‍රදීප් මංජුල මෝදරගේ, සබුබ (නි/61141)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010 මැයි මස 10 වැනි දින,
කොළඹ දී ය.
08-685

---

DRF/21/RECT/3073.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බළ හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අපකීර්ති සහගත ලෙස සේවයෙන් ඉවත් කිරීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරි 2010 ජනවාරි මස 22 වැනි දින සිට අපකීර්ති සහගත ලෙස සේවයෙන් ඉවත් කරනු ලැබීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

ලුතිතන් මාරසිංහලාගේ ප්‍රභාත් මංජුල ධර්මරත්න, කරෙ (නි/62468)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2010 මැයි මස 10 වැනි දින,
කොළඹ දී ය.
08-570

---

DRF/21/RECT/3074.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බළ හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අපකීර්ති සහගත ලෙස සේවයෙන් ඉවත් කිරීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරි 2009 නොවැම්බර් මස 14 වැනි දින සිට අපකීර්ති සහගත ලෙස සේවයෙන් ඉවත් කරනු ලැබීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

දෙවන ලුතිතන් පතිරන්නැහැලාගේ නිලන්ත ඉන්දික පතිරණ, ශ්‍රීලපාහ (නි/63552)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010 මැයි මස 10 වැනි දින,
කොළඹ දී ය.
08-686

---

DRF/21/RECT/3096.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බළ හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අපකීර්ති සහගත ලෙස සේවයෙන් ඉවත් කිරීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරි 2010 පෙබරවාරි මස 22 වැනි දින සිට අපකීර්ති සහගත ලෙස සේවයෙන් ඉවත් කරනු ලැබීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

දෙවන ලුතිතන් ඒකනායක මුදියන්සේලාගේ රනිල් විජේසිංහ ඒකනායක, ශ්‍රීලපාහ (නි/66084)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010 මැයි මස 10 වැනි දින,
කොළඹ දී ය.
08-660

---

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 3/32.

**(285 අධිකාරය වූ) ලංකා දුම්රිය සුහසාධක සංගමය ආඥාපනත**

(285 වැනි අධිකාරය වූ) ලංකා දුම්රිය සුහසාධක සංගමය ආඥාපනතේ 15 වැනි වගන්තිය යටතේ ලංකා දුම්රිය සුහසාධක සංගමය විසින් සාදන ලද රීති.

ලංකා දුම්රිය සුහසාධක සංගමය.

2009,
කොළඹ දී ය.

**රීති**

ලංකා දුම්රිය සුහසාධක සංගමය ආඥාපනතේ 15 වැනි වගන්තිය යටතේ සාදනු ලැබ 1953 පෙබරවාරි මස 6 වැනි දින අංක 10493 දරන *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ කලින් කළ සංශෝධිත රීති පහත දැක්වෙන පරිදි මෙයින් තව දුරටත් සංශෝධනය කරනු ලැබේ :

(1) 2008 ජනවාරි මස 11 වැනි දින අංක 1532 දරන *ගැසට් පත්‍රය* මගින් ඇතුළත් කරන ලද 9 වැනි රීතියේ (4) වැනි ඡේදය ඉවත් කිරීමෙන්

(2) 9 වැනි රීතියට ඉක්බිතිවම පහත දැක්වෙන රීතිය ඇතුළත් කරනු ලබන අතර එය එහි 9අ රීතිය ලෙස බලාත්මක විය යුතුය.

"විශ්‍රාම බෝනස් 9අ (1) සංස්ථාවේ සෑම සාමාජිකයකුටම එම සාමාජිකයා විශ්‍රාම යන අවස්ථාවේදී රුපියල් හතලිස් දහසක විශ්‍රාම බෝනස් මුදලක් ගෙවනු ලැබිය යුතුය.

(2)(1) වැනි ඡේදය යටතේ විශ්‍රාම බෝනස් වශයෙන් ගෙවිය යුතු රුපියල් හතලිස් දහසක මුදල සංස්ථාවේ සෑම සාමාජිකයෙකුගෙන්ම සමාන මුදල් ප්‍රමාණ වලින් අයකර ගනු ලැබිය යුතුය.

එසේ වුව ද, විශ්‍රාම ගිය සාමාජිකයන්ගෙන් සහ සංස්ථාවේ අවුරුදු එකක සාමාජිකත්වය සම්පූර්ණ කර නොමැති සාමාජිකයන්ගෙන් ඉහත කී මුදල් ප්‍රමාණය අයකර ගනු නොලැබිය යුතු ය.

(3) එක් එක් සාමාජිකයාගෙන් අයකරනු ලැබිය යුතු මුදල ආසන්නතම පහෙන් බෙදෙන සංඛ්‍යාවක් විය යුතුය.

(4) මේ බෝනස් මුදල ගෙවීම විශ්‍රාමිකයාට හිමි විශ්‍රාම පාරිතෝෂිකයට අමතරව විය යුතු ය."

(3) අලුත් 9අ රීතිය, 2009 මාර්තු මස 27 වැනි දින සිට බලාත්මක විය යුතුය.

08-551

---

**1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත අංක 25/26 වැනි වගන්තිය යටතේ දැනුම් දීම**

වර්ෂ 1941 අංක 40 දරන ආඥාපනත, 1959 අංක 5 දරන ආඥාපනත, 1964 අංක 24 දරන පනත, 1973 අංක 41 දරන පනත, 1978 අංක 19 දරන පනත ආදී සංශෝධන පනත්වලින් සංශෝධිත, 1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත යටතේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් ඉල්ලුම්පත් අංකයක් ඉදිරියේ දක්වා ඇති ණයකරු, ණයහිමි යන දෙපක්ෂය අතරේ බේරුමක් ඇති කිරීමට ප්‍රයත්නයක් දැරීමට ණය සහනදායක මණ්ඩලය අදහස් කර තිබේ.

02. මේ සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් ණයකරුවන්ගෙන් තමන්ට අයවිය යුතු ණයතුරුස් පිළිබඳ විස්තර ප්‍රකාශයක් තම තමන්ට පැමිණීමට දන්වා ඇති දිනට පෙර මෙම මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස අදාළ ණයහිමියන් වෙත අඥාපනතේ 25(1) 26(1) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එන්. ඩබ්. ගුණදාස,
ලේකම්,
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව.

2010 අගෝස්තු මස 04 වැනි දින,
අංක 80,
අධිකරණ මාවත,
කොළඹ 12,
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

| *ඉල්ලුම්පත් අංකය* | *ණයකරුගේ නම සහ ලිපිනය* | *ණයහිමියාගේ නම සහ ලිපිනය* |
|---|---|---|
| (01) 41415 | කුරුප්පු අච්චිලාගේ දේවිකා ප්‍රියංගනී මිය, අංක 171/1, වැලිය උතුර, මිනුවන්ගොඩ | හෙට්ටිගේ ආශා දර්ශනී වෛජයන්ති පෙරේරා මිය, අංක 150/3. වැලිය උතුර, මිනුවන්ගොඩ |
| (02) 41457 | සුහසිංහ පතිරැන්නැහැලාගේ රවීන්ද්‍ර පුෂ්ප කුමාර බණ්ඩාර මයා, මිරිහතුගොඩ, නාරම්මල | හේමලතා කොළඹ ගෝනදූව මිය, ඉස්වැටියවත්ත, නාරම්මල |
| (03) 41484 | කොග්ගල ගුරුගේ සුමනසිරි මයා, අංක 531, "ගුරුගේ", විමලසාර මාවත, අහංගම | ගල්බොක්ක හේවාගේ රංජිත් මයා, "බර්නාඩ්", කබලාන පාර, කතළුව, අහංගම |
| (04) 41606 | ලියනබංඩාරගේ රුසිරු හේමන්ත මයා, අංක 431, පහළ බෝමිරිය, කඩුවෙල | රණසිංහ ආරච්චිගේ ලක්මාල් ප්‍රසන්න මයා, අංක 137, වදුරාමුල්ල, කොරතොට, කඩුවෙල |
| (05) 41607 | සිංහල පේඩිගේ සෙනෙවිරත්න තිලකසිරි කුමාර මයා, මාහේනගම, වරකාපොල | රන්හොට් පේඩිගේ කාන්ති කුමුදු කුමාරි මිය, නාදෙනිය, දෙල්ගමුව, වරකාපොල |
| (06) 41613 | රාජපක්ෂ ආරච්චිගේ වයලට් මිය, ඉහළ වලහපිටිය, වැව පාර, නාත්තන්ඩිය | දොන් කළුආරච්චිගේ ලියුජින් එතල් ෆ්‍රීඩා මිය, අංක 34/8, හැරල්ඩ් හේරත් මාවත, මූදුකටුව, මාරවිල |
| (07) 41638 | ධර්මපාල කංකානමලාගේ රසික සම්පත් ශ්‍රී ධර්මපාල මයා, අංක 1/122, කලුකොදයාව, මල්වාන | වසන්ත යසපාලිත රණසිංහ මයා, අංක 37/3, වට මාවත, පිළියන්දල |
| (08) 41639 | කළුආරච්චිලාගේ සුබසිංහ මයා, ගනේපල්ල, තැලිගම | ගල්කඩුවරාලලාගේ රංජිත් විජේරත්න මයා, ගනේපල්ල, තුංකිඳ, තැලිගම |

08-679

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

පහත සඳහන් දේපළවල වැඩි විස්තර සඳහා 2010.08.27 වැනි දින ගැසට් පත්‍රය බලන්න.

එක් එක් බැංකුවල අධ්‍යක්ෂ මණ්ඩලයන් විසින් පහත විස්තර කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා යෝජනා සම්මත කර ඇත. :-

**රාජ්‍ය උකස් හා අයෝජන බැංකුව :**

මාතර දිස්ත්‍රික්කයේ, දොඩම්පහල පිහිටි අතපත්තුගේවත්ත නමැති ඉඩමේ ලොට් 12හි අක්. 00, රූ. 00, පර්. 8.43ක් විශාල වූ බිම් කැබැල්ල ;
ගම්පහ දිස්ත්‍රික්කයේ, තිඹිරිගස්කටුව ගමේ පිහිටි වලව්වත්ත නමැති ඉඩමේ ලොට් 1හි අක්. 00, රූ. 00, පර්. 14.3ක් විශාල වූ බිම් කැබැල්ල ;
ගම්පහ දිස්ත්‍රික්කයේ, වතුපිටිවල පිහිටි යකඩවල මූකලාන නමැති ඉඩමේ ලොට් 111හි අක්. 00, රූ. 00, පර්. 19.76ක් විශාල වූ බිම් කැබැල්ල ;

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී :**

පුත්තලම දිස්ත්‍රික්කයේ, කිරිමැටියාන නැගෙනහිර පිහිටි ඉන්නවත්ත නමැති ඉඩමේ ලොට් අංක 02හි අක්. 00, රූ. 00, පර්. 15ක් විශාල වූ බිම් කැබැල්ල ;
පුත්තලම දිස්ත්‍රික්කයේ, අංගම්පිටිය ගමේ පිහිටි මිරිස්වත්ත නමැති ඉඩමේ ලොට් 1හි අක්. 00, රූ. 00, පර්. 35ක් විශාල වූ බිම් කැබැල්ල ;
බදුල්ල දිස්ත්‍රික්කයේ, අලවතුගොඩ පිහිටි මහවත්ත නමැති ඉඩමේ ලොට් 3හි අක්. 00, රූ. 00, පර්. 6.90ක් විශාල වූ බිම් කැබැල්ල සහ තවත් එක් බිම් කැබැල්ලක් ;
පුත්තලම දිස්ත්‍රික්කයේ, සින්නක්කඩු කානි ගමේ පිහිටි රජයේ ඉඩමේ ලොට් 24හි හෙක්ටයාර් 0.0636 විශාල වූ බිම් කැබැල්ල සහ තවත් එක් බිම් කැබැල්ලක් ;
අනුරාධපුර දිස්ත්‍රික්කයේ, අන්නිකුලම ගමේ පිහිටි රජයේ ඉඩමේ අක්. 00, රූ. 02, පර්. 40ක් විශාල වූ බිම් කැබැල්ල සහ තවත් එක් බිම් කැබැල්ලක් ;
කොළඹ දිස්ත්‍රික්කයේ, නාරාහේන්පිට පිහිටි සහාධිපත්‍ය දේපළ ඒකකයේ ඒකක 13හි වර්ග මීටර් 68.1907 විශාල වූ බිම් කැබැල්ල ;
පුත්තලම දිස්ත්‍රික්කයේ, මට්ටකොටුව පිහිටි කෝන්ගහවත්ත නමැති ඉඩමේ ලොට් 1හි අක්. 00, රූ. 00, පර්. 34.25ක් විශාල වූ බිම් කැබැල්ල ;
කොළඹ දිස්ත්‍රික්කයේ, ගංගොඩවිල පිහිටි කහටගහවත්ත නමැති ඉඩමේ ලොට් "1ඩී" හි අක්. 00, රූ. 01, පර්. 28.99ක් විශාල වූ බිම් කොටස සහ තවත් එක් බිම් කැබැල්ලක් ;
ගම්පහ දිස්ත්‍රික්කයේ, කඳාන නැදුරුපිටියේ පිහිටි ජම්බුගහකොටුව නමැති ඉඩමේ ලොට් 2127හි අක්. 00, රූ. 00, පර්. 15ක් විශාල වූ බිම් කැබැල්ල ;
ගම්පහ දිස්ත්‍රික්කයේ, මහර පිහිටි ද ෆිනෑන්ස් කොම්පැනි වත්ත නමැති ඉඩමේ ලොට් 3හි අක්. 00, රූ. 00, පර්. 12.50ක් විශාල වූ බිම් කැබැල්ල ;
ගම්පහ දිස්ත්‍රික්කයේ, පැලියගොඩ පිහිටි සියඹලාගහවත්ත නමැති ඉඩමේ ලොට් 5හි අක්. 00, රූ. 00, පර්. 2.82ක් විශාල වූ බිම් කැබැල්ල සහ තවත් එක් බිම් කැබැල්ලක් ;
කොළඹ දිස්ත්‍රික්කයේ, සූරියපාළුව පිහිටි මිල්ලගහවත්ත නමැති ඉඩමේ ලොට් 10හි අක්. 00, රූ. 00, පර්. 13.50ක් විශාල වූ බිම් කැබැල්ල ;
අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ඥාණකුලම ගමේ පිහිටි ඥාණකුලම නමැති ඉඩමේ ලොට් 209හි හෙක්ටයාර් 0.095 විශාල වූ බිම් කැබැල්ල ;
ගම්පහ දිස්ත්‍රික්කයේ, කිරිකිත්ත ගමේ පිහිටි මිල්ලගහවත්ත නමැති ඉඩමේ ලොට් පී5පී හි අක්. 00, රූ. 00, පර්. 26.35ක් විශාල වූ බිම් කැබැල්ල ;
ගම්පහ දිස්ත්‍රික්කයේ, මාකොළ උතුර පිහිටි මිල්ලගහවත්ත නමැති ඉඩමේ ලොට් "එෆ් 2/2" හි අක්. 00, රූ. 00, පර්. 13ක් විශාල වූ බිම් කැබැල්ල ;
කොළඹ දිස්ත්‍රික්කයේ, මාලබේ පිහිටි කිරිබත්ගහවත්ත නමැති ඉඩමේ ලොට් "13ඒ" හි අක්. 00, රූ. 00, පර්. 13.3ක් විශාල වූ බිම් කැබැල්ල සහ තවත් එක් බිම් කැබැල්ලක් ;
අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මඩවලගම පිහිටි මඩවලගම මූකලාන නමැති ඉඩමේ අක්. 02, රූ. 01, පර්. 22ක් විශාල වූ බිම් කොටස සහ තවත් එක් බිම් කොටසක් ;

**නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී :**

ගම්පහ දිස්ත්‍රික්කයේ, කැන්දලියද්ද පාලුව පිහිටි දෙල්ගහවත්ත නමැති ඉඩමේ ලොට් 01හි අක්. 00, රූ. 00, පර්. 32ක් විශාල වූ බිම් කැබැල්ල ;
ගම්පහ දිස්ත්‍රික්කයේ, මිලට් ගමේ පිහිටි කිරඇල්ලවත්ත නමැති ඉඩමේ ලොට් 354හි අක්. 00, රූ. 00, පර්. 13.20ක් විශාල වූ බිම් කොටස හා තවත් ඉඩම් කොටසක් ;

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී :**

කොළඹ දිස්ත්‍රික්කයේ, වෙනිවැල්කොල පිහිටි මාවතවත්ත නමැති ඉඩමේ ලොට් 1හි අක්. 00, රූ. 00, පර්. 28.37ක් විශාල වූ බිම් කැබල්ල සහ තවත් බිම් කැබලි කිහිපයක් ;
කොළඹ දිස්ත්‍රික්කයේ, අත්තිඩියේ පිහිටි කෝන්ගහවත්ත නමැති ඉඩමේ ලොට් "1ඒ" හි අක්. 00, රූ. 00, පර්. 26ක් විශාල වූ බිම් කොටස ;

**ලංකා බැංකුව :**

මොණරාගල දිස්ත්‍රික්කයේ, මුප්පනේ පිහිටි මාතර ගෙදරවත්ත නමැති ඉඩමේ ලොට් 1හි අක්. 00, රූ. 00, පර්. 35.9 විශාල වූ බිම් කැබැල්ල ;
මොණරාගල දිස්ත්‍රික්කයේ, මුප්පනේ පිහිටි කුමාරවත්ත නමැති ඉඩමේ ලොට් 01 හි අක්. 02, රූ. 02, පර්. 00ක් විශාල වූ බිම් කොටස සහ තවත් එක් බිම් කොටසක් ;
ගම්පහ දිස්ත්‍රික්කයේ, කට්ටුව ගමේ පිහිටි පල්ලන්චේන එස්ටේට් නමැති ඉඩමේ ලොට් 87A අක්. 00, රූ. 00, පර්. 7.50ක් විශාල වූ බිම් කැබැල්ල සහ තවත් එක් බිම් කැබැල්ලක් ;

**නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී :**

කළුතර දිස්ත්‍රික්කයේ, මහ වාද්දුවේ පිහිටි කැටකැරැල්ලගහවත්ත නමැති ඉඩමේ ලොට් 02 හි අක්. 00, රූ. 00, පර්. 13.6 විශාල වූ බිම් කැබැල්ල ;

**සම්පත් බැංකුව පීඑල්සී :**

මාතලේ දිස්ත්‍රික්කයේ, ඕවල පිහිටි දොඹගහමුලේතැන්න වත්ත නමැති ඉඩමේ ලොට් 02 හි අක්. 00, රූ. 00, පර්. 9ක් විශාල වූ බිම් කැබැල්ල ;
ගම්පහ දිස්ත්‍රික්කයේ, උතුරු පල්ලන්සේන ගමේ පිහිටි ඉඹුල්ගහවත්ත නමැති ඉඩමේ ලොට් 01හි අක්. 00, රූ. 00, පර්. 33.75ක් විශාල වූ බිම් කැබැල්ල ;
හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ලේ පිහිටි පල්ලියවත්ත නමැති ඉඩමේ ලොට් Nහි අක්. 00, රූ. 00, පර්. 36.2ක් විශාල වූ බිම් කැබැල්ල සහ තවත් එක් බිම් කැබැල්ලක් ;
රත්නපුර දිස්ත්‍රික්කයේ, බටුගෙදර ගමේ පිහිටි පුස්සලියද්ද වත්ත නමැති ඉඩමේ ලොට් "ඒ" හි අක්. 00, රූ. 00, පර්. 21ක් විශාල වූ බිම් කැබැල්ල සහ තවත් එක් බිම් කැබැල්ලක් ;
කොළඹ දිස්ත්‍රික්කයේ, වැලිවිට පිහිටි ගොඩපරගහවත්ත නමැති ඉඩමේ ලොට් "A" හි අක්. 00, රූ. 00, පර්. 10ක් විශාල වූ බිම් කැබැල්ල ;
කොළඹ දිස්ත්‍රික්කයේ, මොරටුවැල්ලේ පිහිටි ගොරකගහවත්ත නමැති ඉඩමේ කැබලි ලොට් 1හි අක්. 00, රූ. 00, පර්. 7.50ක් විශාල වූ බිම් කැබැල්ල සහ තවත් එක් බිම් කැබලි කිහිපයක් ;
කළුතර දිස්ත්‍රික්කයේ, දිබ්බැද්දේ පිහිටි කහටගහවත්ත නමැති ඉඩමේ ලොට් 5හි අක්. 00, රූ. 00, පර්. 20ක් විශාල වූ බිම් කැබැල්ල ;
පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, උඩවෙලගම ගමේ පිහිටි පට්ටියදමන මූකලාන නමැති ඉඩමේ ලොට් 405 හි හෙක්ටයර් 0.348 විශාල වූ බිම් කැබැල්ල ;
කොළඹ දිස්ත්‍රික්කයේ, නාවල කොස්වත්තේ පිහිටි දෙල්ගහවත්ත කොටසක් නමැති ඉඩමේ ලොට් "A" හි අක්. 00, රූ. 00, පර්. 5.48ක් විශාල වූ බිම් කැබැල්ල ;
කළුතර දිස්ත්‍රික්කයේ, මදුරාවල පිහිටි ගල්ගොඩවත්ත නමැති ඉඩමේ අක්. 00, රූ. 00, පර්. 12ක් විශාල වූ බිම් කැබැල්ල ;
පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, ගල්තඹරව පිහිටි ගල්තඹරව නමැති ඉඩමේ ලොට් 2366හි අක්. 00, රූ. 01, පර්. 39ක් විශාල වූ බිම් කැබැල්ල ;

**සීමාසහිත සම්පත් බැංකුව :**

බදුල්ල දිස්ත්‍රික්කයේ, කහත්තේවෙල පිහිටි ඇල්ලෙන් ඉහළවත්ත නමැති ලොට් "ඒ" හි අක්. 00, රූ. 00, පර්. 34ක් විශාල වූ බිම් කැබැල්ල ;

**මහජන බැංකුව :**

ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ලේ චීන කොරටුවේ පිහිටි කැකිරිබොක්ක වත්ත නමැති ඉඩමේ ලොට් 08හි අක. 00, රූ. 00, පර්. 7.183ක් විශාල වූ බිම් කැබැල්ල ;

**ඩීඑෆ්සීසී බැංකුව :**

කළුතර දිස්ත්‍රික්කයේ, බෝතලේ ගමේ පිහිටි පොල්ගහමූකලාන නමැති ඉඩමේ ලොට් "662A" හි අක්. 00, රූ. 03, පර්. 09 විශාල වූ බිම් කොටස ;

**ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව :**

කොළඹ දිස්ත්‍රික්කයේ, රත්මලාන දකුණ පිහිටි කඳවල වතුයාය නමැති ඉඩමේ ලොට් "X" හි අක්. 00, රූ. 01, පර්. 3.62ක් විශාල වූ බිම් කොටස

මුද්‍රණය හා බෙදාහැරීම ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසිනි.
www.documents.gov.lk